# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயற்றிறன் அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2025



**වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

**நீர்ப்பாசனத் திணைக்களம்**

**IRRIGATION DEPARTMENT**

# වැය ශීර්ෂ - 282

# වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ**

**වැය ශීර්ෂ අංකය- 282**

අන්තර්ගතය පිටු අංකය


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

- 1.1 හැඳින්වීම
- 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු
- 1.3 ප්‍රධාන කාර්යයන්
- 1.4 සංවිධාන සටහන
- 1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රධාන අංශ

පරිච්ඡේදය 02- ප්‍රගතිය හා ඉදිරි දැක්ම 13

- 2.1 විශේෂ ජයග්‍රහණ සහ ප්‍රගතිය
- 2.2 අභියෝග
- 2.3 ඉදිරි ඉලක්ක

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය 43

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක 51

පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 51

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 52

පරිච්ඡේදය 07- අනුකූලතා වාර්තාව 63

## පරිච්ඡේදය 01 : ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංවර්ධනය සඳහා වගකිවයුතු ප්‍රධාන ආයතනය වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි. විදේශීය හෝ වෙනත් බාහිර උපදේශන නොමැතිව ජල සම්පත් සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ශක්‍යතා අධ්‍යයනය, විමර්ශන, ක්‍රම සැලසුම්, සැලසුම් සහ ඉදිකිරීම් කටයුතු සිදු කරන එකම ආයතනය වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි.

මෙම දෙපාර්තමේන්තුව පොදු වැඩ දෙපාර්තමේන්තුවෙන් වෙන්ව වෙනම දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කිරීම එවකට බ්‍රිතාන්‍ය ආන්ඩුකාරවරයාගේ නියමය පරිදී සිදුවී ඇති අතර 1900 මැයි 15 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස ප්‍රථම වාරිමාර්ග අධ්‍යක්ෂවරයා පත් කර කාර්යාලය බලාත්මක කර ඇත. පැවති වාරිමාර්ග වැඩ, කුඹුරු සහ අනෙකුත් වාරි පහසුකම් සැපයෙන ඉඩම් සඳහා නීති ඇතුලත් ආඥා පනත් වෙනුවට 1906 අංක 16 දරණ වාරිමාර්ග ආඥා පනත ප්‍රකාශයට පත් කර එමගින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත බලතල පවරා දී ඇත. ඒ අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව 2025 වර්ෂයේදී සිය 125 වන සංවත්සරය සමරන ලදී.

මේ වන විට වගා ඉඩම් හෙක්ටයාර 324,800 කට වාරිමාර්ග පහසුකම් සපයන අතර 2030 වර්ෂය වන විට එම ප්‍රමාණය හෙක්ටයාර 350,000 දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇත. එසේම ජලය හා සම්බන්ධව කටයුතු අනිකුත් රේඛීය ආයතන වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන ආදී වූ පාර්ශවකරුවන් සමග සහයෝගයෙන් වැඩ කර අවශ්‍ය අවස්ථා වලදී තාක්ෂණික සේවා සැපයීම ද සිදු කරනු ලබයි.

ජාතියේ ආහාර සුරක්ෂිතතාවය වෙනුවෙන් අපගේ ප්‍රධාන ආහාරය වන සහල් නිපදවීම පිණිස වී වගාව සඳහා ජලය සම්පාදනය කරන අතරම ඒ ඒ ප්‍රදේශ වල අනෙකුත් අතිරේක බෝග වගාවන් ඇතුළු සියලු ජල අවශ්‍යතා සපුරාලීම පිණිස ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

### 1.2.1 දැක්ම

“අහසින් වැටෙන එක දිය බිඳුවකුදු ලෝකෝපකාරයෙන් තොරව මුහුදට ගලා යා නොදෙනු” යන මහා පරාක්‍රමබාහු රජතුමාගේ පාඨය ගුරුතැන්හිලා, පරිසරයද සුරකිමින්, තිරසාර ආර්ථික හා සමාජ සංවර්ධනය සහතික කරනු සඳහා සෑම වැසි ජල බිඳුවක්ම පරිසර හිතකාමී ලෙස තිරසාර අයුරින් මිනිසාගේ යහපත සඳහා යොදා ගැනීමයි.

### 1.2.2 මෙහෙවර

කෘෂිකර්මයට සෘජුවමත්, පාරිසරික, ගෘහස්ත, කාර්මික හා විදුලිජනක අවශ්‍යතා සඳහා වක්‍රවත් අවශ්‍ය ජලය සැපයීම සඳහා සමාන්තර ආයතන සමඟ සහයෝගයෙන් රටේ සම්පත් භාවිතයට ගැනීම, සංවර්ධනය, සංරක්ෂණය, පාලනය, බෙදාහැරීම හා කළමනාකරණය මගින් එම සම්පත් වලින් රටට උපරිම ප්‍රතිලාභයක් ලබාදීම.

### 1.2.3 බලතල පැවරී ඇති ප්‍රධාන නෛතික විධිවිධාන

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛණයේ සඳහන් වාරිමාර්ග යන කරුණ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාව යටතේ අමාත්‍ය මණ්ඩලයෙහි අමාත්‍යවරුන් සහ විෂය සහ කාර්යයන් වෙන් කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය
- 1994 අංක 13, 1990 අංක 34, 1983 අංක 23 දරන වාරිමාර්ග (සංශෝධන) පනත් මගින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනත
- 1924 අංක 4 දරන ගංවතුර ආරක්ෂණ ආඥා පනත
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 788 (1) සහ (2)

### 1.2.4 අරමුණු

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ;

- පාරිසරික තිරසාරත්වය සහතික කරමින් වාරි ජල සම්පාදිත කෘෂිකර්මය, ජල විදුලි නිෂ්පාදනය, ගංවතුර ආරක්ෂණය, ගෘහස්ත ප්‍රයෝජනය, කාර්මික ප්‍රයෝජනය, ජල ජීවී වගාව සංවර්ධන උදෙසා භූමි සහ ජල සම්පත් සංවර්ධනය.
- වාරිමාර්ග හා ජල අපවහන ව්‍යාපෘතිවල ඇති වගා කළ හැකි ඉඩම් සඳහා උස්සාන වාරිමාර්ග පහසුකම් සැපයීම, ජල අපවහන පද්ධතීන් සැපයීම හා මුහුදු ජලය ගලා ඒම වැලැක්වීම.
- පානීය ජලය සඳහා පහසුකම් සැපයීම, ගංවතුර අවදානම ඇති ප්‍රදේශවලට ගංවතුර ආරක්ෂණ හා ජල අපවහන පහසුකම් සැපයීම.
- ග්‍රාමීය ජනයාගේ ගොවි ආදායම් වැඩි කිරීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ ග්‍රාමීය ප්‍රදේශවල දිළිදුකම තුරන් කිරීම.
- තිරසාර කෘෂිකර්මාන්තය සහ වෙනත් භාවිතයන් සඳහා ජලය අරපිරිමැසුම්දායි වශයෙන් කළමනාකරණය කිරීම.
- විශාල, මධ්‍යම ප්‍රමාණයේ සහ අන්තර් පලාත් වාරිමාර්ග ව්‍යාපෘතීන් සඳහා ජලය සහ ඉඩම් සඳහා වූ ඵලදායීතා වර්ධනය.
- විශාල, මධ්‍යම ප්‍රමාණයේ සහ අන්තර් පලාත් වාරිමාර්ග පද්ධති සඳහා ඒකාබද්ධ ජලසම්පත් කළමනාකරණය සහ සහභාගීත්ව කළමනාකරණය.
- වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා ඇති ගංගා ද්‍රෝණිවල ඒකාබද්ධ ජලසම්පත් කළමනාකරණය සහ සහභාගීත්ව කළමනාකරණය.

## 1.3 ප්‍රධාන කාර්යයන් සහ අදාළ නෛතික විධිවිධානයන්

- පාරිසරික සාධක වලට ප්‍රමුඛතාවය දී ඉඩම් හා ජල සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සඳහා ගංගා ද්‍රෝණි සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රධාන සැලසුම් සකස් කිරීම.- ( වාරිමාර්ග අඥාපනත)

- වාරිමාර්ග, ජල විදුලිය සහ ගංවතුර පාලනය සඳහා වන නව ව්‍යාපෘති සඳහා සවිස්තර සැලසුම් සකස් කිරීම. – (වාරිමාර්ග අඥාපනත / ගංවතුර ආරක්ෂණ ආඥාපනත)

- නව හා පවතින ගොවිතැන් කළ හැකි ඉඩම් වල අස්වැන්න වැඩි කිරීම සඳහා ගුරුත්ව හා උස්සාන වාරිමාර්ග ක්‍රම යටතේ ජල සංරක්ෂණය, හැරවීම හා බෙදා හැරීම සිදු කිරීම සඳහා නව ව්‍යාපෘති ඉදිකිරීම සහ ගොවීන් පදිංචි කිරීමේ ව්‍යාපෘති සැකසීම. - (ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව /වාරිමාර්ග අඥාපනත)

- ජලාපවහන, ගංවතුර පාලන සහ ලවණ දිය බැහැර කිරීමේ ව්‍යාපෘති ඉදි කිරීම මගින් එම බලපෑම් ඇති ඉඩම් වල ගොවිතැන් කිරීමේ කටයුතු අනතුරකින් තොරව කරගෙන යාමට ඉඩ සැලසීම. – (වාරිමාර්ග අඥාපනත)

- ගංවතුරෙන් සිදුවන හානිය අවම කිරීම හෝ අවම කිරීම සඳහා ජලාපවහන හා ගංවතුර ආරක්ෂණ පහසුකම් සැපයීම. - (ගංවතුර ආරක්ෂණ ආඥාපනත)

- මධ්‍යම පරිමාණ හා ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම, ජලාපවහන හා ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රම, ලවණ ජලය බැහැර කිරීමේ යෝජනා ක්‍රම වල මෙහෙයුම් හා නඩත්තු කටයුතු, වැඩිදියුණු කිරීම් සහ පුනරුත්ථාපන කටයුතු කිරීම මගින් ප්‍රශස්ථ ජල කළමනාකරණයක් ප්‍රතිලාභින්ගේ සහභාගීත්වය ලබා ගනිමින් ඉටු කිරීම. අන්තර් අංශ භාවිතය, ගෘහස්ථ හා කාර්මික භාවිතය සහ පාරිසරික අවශ්‍යතා සඳහා ද ජලය සැපයීම වෙනුවෙන් වාරිමාර්ග ජලාශ ඉදිකිරීම සහ සංරක්ෂණය කර පවත්වා ගැනීම. - (වාරිමාර්ග අඥාපනත)

- කෘෂිකාර්මික හා ගෘහස්ත පරිභෝජනයේ තිරසාර ජල සැපයුම සඳහා වේලි ඇතුළු ජල යටිතල පහසුකම් නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම. - (ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව /වාරිමාර්ග අඥාපනත)

- ජල සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන පර්යේෂණ ජල ශක්ති, ජල විද්‍යා, ඉංජිනේරු ද්‍රව්‍ය, ඉංජිනේරු භූවිද්‍යා, භූවිද්‍යාත්මක තොරතුරු, ඉඩම් පරිහරණ යන අංශ වල සිදු කිරීම.

- වාරිමාර්ග අංශයේ මානව සම්පත් ප්‍රශස්ථව උපයෝජනය සඳහා මානව සම්පත් සංවර්ධනය.- (ආයතන සංග්‍රහය)

- රජයේ මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විගණන පද්ධතිය, ගිණුම් වාර්තා කිරීම, මූල්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම. – (මුදල් රෙගුලාසි)

- ජල සම්පත් වැඩි දියුණු කිරීම, ඉංජිනේරුමය මූලික දැනුම, පස් වැඩ සහ කොන්ක්‍රීට් වැඩ වල තත්ත්වය පාලනය, ජල ශක්ති ආකෘති පරීක්ෂාවට ලක් කිරීම සහ ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සම්බන්ධව රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා සහ පොදු හා පෞද්ගලික ආයතන සඳහා උපදෙස් ලබා දීම.

- රටේ ආහාර සුරක්ෂිතතාවය වඩාත් තහවුරු කිරීම සඳහා වාරි ව්‍යාපාරයන්හී ඵලදායිතාවය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන මහා වාරි හා මධ්‍ය වාරි ව්‍යාපාරයන්හී ඒකාබද්ධ හා සහභාගීත්ව වාරිමාර්ග කළමනාකරණ ක්‍රමවේද සංකල්පය මත ව්‍යාපාර කළමනාකාරණය සිදු කිරීම. - (වාරිමාර්ග අඥාපනත /1994 අංක 13 සංශෝධන)

# 1.4 සංවිධාන සටහන

## 1.4.1 සංවිධාන සටහන - වාරිමාර්ග දෙපාර්තමේන්තුව




* නියමිත තනතුරක් නොවන අතර අවශ්‍යතාවය මත පදනම්ව අනුමත වාරිමාර්ග අධ්‍යක්ෂ තනතුරු 36 තුළ පත් කිරීම සිදු කරයි.

### 1.4.2 සංවිධාන සටහන - කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය




### 1.4.3 සංවිධාන සටහන - ප්‍රාදේශීය වාර්මාර්ග ඉංජිනේරු කාර්යාලය



### 1.4.4 සංවිධාන සටහන - යාන්ත්‍රික අංශය




### 1.4.5 සංවිධාන සටහන - යාන්ත්‍රික වැඩපොල



වගුව 1: සංවිධාන සටහන සඳහා සංක්ෂිප්තයන්

| කෙටි යෙදුම | සටහන | වගකීම් දරන ක්ෂේත්‍රය |
|---|---|---|
| වා.අ.ජ. | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් | සමස්ත කාර්යයන් : ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, සමස්ත අධීක්ෂණය සහ කළමනාකරණය, බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණය, කාර්ය මණ්ඩලය සහ ප්‍රතිපාදන මෙහෙයවීම, පුහුණුව සහ පොදු අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කිරීම<br>තාක්ෂණික කාර්යයන්: විශාල පරිමාණයේ ව්‍යාපෘති සඳහා ක්‍රමසැලසුම් කිරීම, විමර්ශනය, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම,විශාල හා මධ්‍යම ප්‍රමාණයේ වැඩකටයුතුවල මෙහෙයුම්, වැඩිදියුණු කිරීම් සහ ජල කළමනාකරණය සහ සැලසුම් කිරීම, විමර්ශනය, සැලසුම් කිරීම සහ තත්ත්ව පාලනය සඳහා උපදේශන සේවා ලබා දීම |
| අති.වා.අ.ජ (වි,සැ.හා සැ.) | අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (විමර්ශන, ක්‍රම සැලසුම් හා සැලසුම් ) | වාරිමාර්ග ව්‍යාපෘති සම්බන්ධයෙන් වන විමර්ශන සිදු කිරීම, ක්‍රම සැලසුම් සකස් කිරීම සහ සැලසුම් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය සිදු කිරීම. |
| අති.වා.අ.ජ (ක්‍රම. කළ.) | අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් ( ක්‍රම කළමනාකරණ) | ගුරුත්ව වාරි යෝජනා ක්‍රමවල මෙහෙයුම්,නඩත්තු කිරීම, ජල කළමනාකරණය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය. |
| අති.වා.අ.ජ (ඉදි. හා සං.) | අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (ඉදිකිරීම් හා සංවර්ධන) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය. |
| අති.වා.අ.ජ (ගංගා. කළ.) | අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (ගංගාධාර කලමනාකරණ) | ජලාපවහනය, ගංවතුර පාලනය සහ ගංගාධාර කළමනාකරණය සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය. |
| අති. අ.ජ (පාලන) | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) | ප්‍රධාන කාර්යාලයට සහ දිවයින පුරා පිහිටා ඇති ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ සියලුම පරිපාලන කටයුතු අධීක්ෂණය සහ සම්බන්ධීකරණය. |
| ප්‍ර.මූ.නි. | ප්‍රධාන මූල්‍ය නිලධාරී | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ අනෙකුත් අදාළ නීතිරීති සහ රෙගුලාසි වලින් පැවරී ඇති බලතල අනුව ගණන්දීමේ නිලධාරියා ලෙස රාජකාරි ඉටු කිරීම සඳහා සහය වීම. |
| වා.අ.(ව්‍යා.සැ. හා නි.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (ව්‍යාපෘති සැලසුම් සහ නිර්මාණ) | නව ජල සම්පත් සංවර්ධන යෝජනා හඳුනා ගැනීම,ජල සම්පත් බහු විධ භාවිතය සඳහා ශක්‍යතා පරීක්ෂා කිරීම, සැලසුම් කිරීම, විස්තරාත්මක සැලසුම් සකස් කිරීම සහ ඉදිකිරීම් සඳහා අවශ්‍ය සැලසුම් සැපයීම. |
| වා.අ. (ජල.ස.සැ.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල සම්පත් සැලසුම්) | සමාජ, ආර්ථික සහ පාරිසරික සංවර්ධන ඉලක්ක දිගුකාලීනව සපුරා ගැනීම සඳහා අවශ්‍ය වන ජාතික ජල සම්පත් සැලැස්ම සකස් කිරීම, වැඩිදියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම. |
| වා.අ. (ඉං.භූ.වි.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (ඉංජිනේරු භූ විද්‍යා) | ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති සැලසුම් කරණය සඳහා අවශ්‍ය භූගත පරීක්ෂණ සහ අත්තිවාරම් වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික උපක්‍රම යෙදීම. ගොඩබිම සහ වෙරළ ආශ්‍රිතව විමර්ශන සඳහා උපදේශන සේවා සැපයීම, දැනට භාවිතයේ පවතින නිර්මිත වල කාන්දුවීම් සහ ස්ථායීතාවය ආශ්‍රිත ගැටළු සඳහා විසඳුම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. |

| කෙටි යෙදුම | සටහන | වගකීම් දරන ක්ෂේත්‍රය |
|---|---|---|
| වා.අ (ඉං.ද්‍රව්‍ය) | වාරිමාර්ග අධ්‍යක්ෂ (ඉංජිනේරු ද්‍රව්‍ය) | ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණ කිරීම, පස් වලින් ඉදි කරන වේලි සැලසුම් කිරීම සහ ඉදිකිරීම් ස්ථානවල තත්ත්ව විමර්ශනය සහතික කිරීම. විමර්ශනය කිරීම, සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් කටයුතුවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මෙන්ම අනෙකුත් අවශ්‍ය ආයතනවලට සේවා සැපයීම. |
| වා.අ. (තො.ස.තා/භූ. තො.තා) | වාරිමාර්ග අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ / භූගෝලීය තොරතුරු තාක්ෂණ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සියලුම අංශ , ශාඛා, කලාප සහ කොට්ඨාශ සඳහා පරිගණක සහ තොරතුරු තාක්ෂණය සම්බන්ධ සේවාවන් සැපයීම සහ අවශ්‍ය අංශ සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා භූගෝලීය තොරතුරු තාක්ෂණික සේවා,සහාය සහ පුහුණුව ලබා දීම. |
| වා. අ (ජල වි සහ ආපදා . කළ.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල විද්‍යා සහ ආපදා කළමනාකරන) | ජල සම්පත් සංවර්ධනය සහ ගංවතුර පුරෝකථනය සඳහා ජල විද්‍යාත්මක සහ කාලගුණික දත්ත රැස් කිරීම, සැකසීම සහ බෙදා හැරීම, ප්‍රධාන ගංගා සඳහා පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණය කිරීම. |
| වා.අ. (ජල ශක්ති) | වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල ශක්ති) | වාරිමාර්ග ව්‍යාපෘතිවල ආදර්ශ අධ්‍යයනයන් සිදු කිරීම, විෂයය පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය ආයතනවලට උපදේශන සේවා සැපයීම සහ උපකරණ ඒකකය පවත්වාගෙන යාම. |
| වා.අ. (පා. අ.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (පාරිසරික අධ්‍යයන) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විෂය පථය යටතේ ඇති සියලු ව්‍යාපෘති සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් හෝ ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජිතයන්ගෙන් පාරිසරික අනුමැතියන් (EIA/IEE) ලබා ගැනීම, අනෙකුත් රාජ්‍ය හෝ පුද්ගලික ආයතන විසින් මෙහෙයවනු ලබන කුඩා ජල විදුලි ව්‍යාපෘති, පානීය ජල ව්‍යාපෘති, විදුලිබල සම්ප්‍රේෂණ ව්‍යාපෘති, මහාමාර්ග ව්‍යාපෘති ආදිය සඳහා අවශ්‍ය අවස්ථාවන් වලදී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිෂ්කාශන නිකුත් කිරීම ආදී දෙපාර්තමේන්තුව මඟින් ඉටුකල යුතු පාරිසරික අධ්‍යයනයට අදාල කටයුතු සඳහා මැදිහත්වී ක්‍රියාත්මක කිරීම. |
| වා.අ (ක්‍ර. සැ. සහ සැ.මධ්‍යම) | වාරිමාර්ග අධ්‍යක්ෂ- (ක්‍රම සැලසුම් සහ සැලසුම් -මධ්‍යම) | මහනුවර, කුරුණෑගල, පුත්තලම සහ අම්පාර යන කලාප වල මධ්‍යම හා කුඩා වාරිමාර්ග ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයනය, ක්‍රම සැලසුම් සහ සැලසුම් කටයුතු සිදු කිරීම. |
| වා. අ ( ක්‍ර. සැ. සහ සැ - උ.හා උ.මැද ) | වාරිමාර්ග අධ්‍යක්ෂ (ක්‍රම සැලසුම් සහ සැලසුම් - උතුරු හා උතුරු මැද කලාපය) | අනුරාධපුර, මන්නාරම, පොළොන්නරුව සහ ත්‍රිකුණාමලය යන කලාප වල මධ්‍යම හා කුඩා වාරිමාර්ග ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයනය, සැලසුම් සහ සැලසුම් කටයුතු. |
| අධ්‍ය (ඉ. පරි.) | අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ) | වාරිමාර්ග සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති වල ඉඩම් පරිහරණය තීරණය කිරීම සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක විද්‍යාත්මක තොරතුරු සැපයීම. |
| වා.අ (වි.ඉදි.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (විශාල ඉදි කිරීම්) | මහා පරිමාණ වාරිමාර්ග හා ජනාවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම. |
| වා. අ (ප්‍රා.සං.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (ප්‍රාදේශීය සංවර්ධන) | මධ්‍යම පරිමාණ වාරිමාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම. |
| වා.අ. (භෞ.ස.ක.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (භෞතික සම්පත් කළමනාකරණ) | දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශයේ අයවැය ප්‍රතිපාදන නිසි පරිදි යොදා ගනිමින් යන්ත්‍රෝපකරණ සහ වාහන හැර අනෙකුත් සියලුම වත්කම් කළමනාකරණය කිරීම සහ සියලුම ගුරුත්ව වාරිමාර්ග ව්‍යාපාර නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම. |

| කෙටි යෙදුම | සටහන | වගකීම් දරන ක්ෂේත්‍රය |
|---|---|---|
| වා.අ. (ජල. ක.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල කළමනාකරණ) | ජල ඒකකයකින් සහ ඉඩම් ඒකකයකින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීමට සහ ගොවි ජනතාවගේ ආදායම ඉහළ නැංවීම සඳහා ගොවීන්ගේ සහභාගීත්වයෙන් වාරිමාර්ග පද්ධතිවල කාර්යක්ෂමතාවයට, ඵලදායීතාවයට සහ තිරසාර කළමනාකරණයට අවශ්‍ය පහසුකම් සැලසීම. |
| වා.අ. (ගං.කළ) | වාරිමාර්ග අධ්‍යක්ෂ (ගංගාධාර කළමනාකරණ) | භෞතික හා පාරිසරික සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා සියලු පාර්ශ්වයන්ගේ සම්බන්ධීකරණය සහ සහභාගීත්වය ඇතිව ගංගාධාර සංරක්ෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීම. |
| වා.අ (ජලා. හා ගං. පද්.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (ජලාපවහන හා ගංවතුර පද්ධති) | පහත් බිම්වල ජලාපවහන සහ ලවණ ජලය බැහැර කිරීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් කුඹුරු වගා කිරීම සඳහා අවශ්‍ය පරිසරය සකස් කිරීම, ගංවතුර ආරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් මිනිස් ජීවිත, පොදු සහ පෞද්ගලික දේපළ සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබා දීම. |
| වා. අ ( වැ.කළ.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (වැඩසටහන් කළමනාකරණ) | ප්‍රාග්ධන අයවැය සැලසුම් කිරීම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කිරීම, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සහාය වීම, ප්‍රගතිය වාර්තා කිරීම සහ අනෙකුත් වාර්ෂික හා කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීම |
| වා.අ (කො.හා ප්‍ර.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන) | වැඩ, භාණ්ඩ හා සේවා සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය දෙපාර්තමේන්තුව තුල නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සහ ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සඳහා ක්‍රියා පටිපාටි යාවත්කාලීන කිරීම. |
| වා.අ (පුහුණු / ප.ස. සහ ක්‍ර.ප්‍ර.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (පුහුණු / පර්යේෂණ සහාය සහ ක්‍රමවේද ප්‍රවර්ධන) | දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩල වල කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම, ප්‍රධාන කාර්යාලය, කලාප සහ ගල්ගමුව වාරිමාර්ග පුහුණු ආයතනයේ පුහුණු කටයුතු සම්බන්ධීකරණය, සියලුම කාණ්ඩවල සේවකයින් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියට අනුව බඳවා ගැනීමේ විභාග සහ කාර්යක්ෂමතා කඩයිම් විභාග පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය සහ පැවැත්වීම. දෙපාර්තමේන්තුවේ සියලුම සේවාවන් සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීමට අදාළව සහ අනෙකුත් විශේෂ ක්ෂේත්‍රවල පර්යේෂණ ප්‍රවේශය තුළින් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා සහාය ලබා දීම. |
| වා.අ. (වැ.පො.හා ගොඩ.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (වැඩ පොදු හා ගොඩනැගිලි සේවා) | පාර්ලිමේන්තු උපදේශන කමිටු කටයුතු, මහජන පෙත්සම් යනාදී විවිධ කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම, රත්මලානේ පිහිටි නිල නිවාස,ප්‍රධාන කාර්යාලය, අංක 34 පරිශ්‍රය පරිපාලනය, නඩත්තු කිරීම, ඉදිකිරීම්, වැඩිදියුණු කිරීම් සහ සම්පත් වෙන් කිරීමේ කටයුතු සිදු කිරීම. |
| වා.අ. (ඉං.වි.තා / වා.ඵ.ප්‍ර.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (ඉංජිනේරු, විද්‍යා සහ තාක්ෂණික සේවා / වාරිමාර්ග ඵලදායිතා ප්‍රවර්ධන) | ඉංජිනේරු, විද්‍යාත්මක, ගණකාධිකාරී, පරිපාලන සහ ඉංජිනේරු සහකාර සේවයේ පරිපාලන කටයුතු සිදු කිරීම සහ අධීක්ෂණය.<br>වජ් හවුල ක්‍රියාත්මක වාරිමාර්ග ව්‍යාපාර වල සහභාගීත්ව කළමනාකරණ ප්‍රවේශය සමඟින් වාරි කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව ඉහළ නැංවීම සහ වජ් හවුල වැඩසටහන කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම. |
| වා.අ. (වා.අ.ආ.) | වාරිමාර්ග අධ්‍යක්ෂ (වාරිමාර්ග අභ්‍යාස ආයතනය) | ඉංජිනේරු සහකාරවරුන් සඳහා වාරි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම, පුහුණු අංශයේ ඉල්ලීම මත සියලුම සේවා කාණ්ඩ සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියට අනුව සේවා පුහුණු වැඩසටහන් පැවැත්වීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සහ දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩල වල කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව සැලසීම. |

| කෙටි යෙදුම | සටහන | වගකීම් දරන ක්ෂේත්‍රය |
|---|---|---|
| ක.වා.අධ්‍ය. | කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් කලාපය තුල දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම, සැලසුම් ප්‍රමිතීන් සහ ඉදිකිරීම් වැඩ වල ගුණාත්මකභාවය සහතික කරමින් කලාපයේ පරිපාලනය කිරීම, නිසි ජල කළමනාකරණය සහතික කරමින් කලාපයේ වාරිමාර්ග කටයුතු මෙහෙයවීම සහ නඩත්තු කිරීම, වත්කම් නඩත්තු කිරීම සහ ආරක්ෂා කිරීම, අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ මඟපෙන්වීම යටතේ සහ දිස්ත්‍රික් මට්ටමේ අවශ්‍යතා සමඟ සාකච්ඡා කර කලාපයේ වාරිමාර්ග කටයුතු සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය සකස් කිරීම, තාක්ෂණික පාලනය සඳහා ප්‍රධාන හෝ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහ අනෙකුත් කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම, මූල්‍ය පාලනය සඳහා ගණකාධිකාරී සහ කාර්ය මණ්ඩලය මෙහෙයවීම. කාර්ය මණ්ඩල පාලනය සඳහා පරිපාලන නිලධාරී සහ කාර්ය මණ්ඩලය මෙහෙයවීම, ස්ථාවරයන් සහ මාර්ගෝපදේශ අනුව සුළු හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග වැඩ කටයුතු විමර්ශනය කිරීම, ක්‍රම සැලසුම් හා සැලසුම් කිරීම සහ ඇස්තමේන්තු පිළියෙළ කිරීම. නිවැරදි ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් ඒකක ගාස්තු ගණනය කිරීම, ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය විමර්ශන, ක්‍රම සැලසුම් සහ සැලසුම් කාර්යයන් ක්‍රියාත්මක කිරීම. භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම, වා.අ (වී.ඉදි) වෙනුවෙන් විශාල ඉදිකිරීම් අංශය මගින් ක්‍රියාත්මක ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සමස්ත අධීක්ෂණය, ක්‍රියාත්මක ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති සම්බන්ධව දිස්ත්‍රික්කයේ අනිකුත් ආයතන වෙත තොරතුරු සැපයීම, කලාපය තුළ පිහිටා ඇති ක්ෂේත්‍ර යාන්ත්‍රික වැඩපළවල් කළමනාකරණය කිරීම. |
| අධ්‍යක්ෂ (පාලන) | අධ්‍යක්ෂ (පාලන) | පරිපාලන කටයුතු සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) ට සහාය වීම. |
| යා. අධ්‍ය. (ප්‍ර.කා. සහ ද.) | අධ්‍යක්ෂ යාන්ත්‍රික (ප්‍රධාන කාර්යාලය සහ දකුණ ) | ප්‍රධාන කාර්යාලය, කොළඹ, ගාල්ල, හම්බන්තොට සහ මොණරාගල යන කලාපවලට අයත් සියලුම වාහන, යන්ත්‍රෝපකරණ සහ වාරි නිර්මිත හා සම්බන්ධ යාන්ත්‍රික ව්‍යුහයන් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම. |
| යා. අධ්‍ය. (මධ්‍යම) | අධ්‍යක්ෂ යාන්ත්‍රික (මධ්‍යම) | මහනුවර, කුරුණෑගල, පුත්තලම, බදුල්ල, අම්පාර සහ මඩකලපුව යන කලාපවලට අයත් සියලුම වාහන, යන්ත්‍රෝපකරණ සහ වාරි නිර්මිත හා සම්බන්ධ යාන්ත්‍රික ව්‍යුහයන් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම. |
| යා. අධ්‍ය. (උතුරු මැද ) | අධ්‍යක්ෂ යාන්ත්‍රික ( උතුරු මැද ) | අනුරාධපුර, පොළොන්නරුව, මන්නාරම සහ ත්‍රිකුණාමලය යන කලාපවලට අයත් සියලුම වාහන, යන්ත්‍රෝපකරණ සහ වාරි නිර්මිත හා සම්බන්ධ යාන්ත්‍රික ව්‍යුහයන් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම. |
| ප්‍ර.ග. (මූල්‍ය) | ප්‍රධාන ගණකාධිකාරී (මූල්‍ය) | ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලයේ මූල්‍ය කටයුතු අධීක්ෂණය සඳහා ප්‍රධාන මූල්‍ය නිලධාරීට සහාය වීම. |
| ප්‍ර.ග. (ගිණුම් හා ඇස්.) | ප්‍රධාන ගණකාධිකාරී (ගිණුම් හා ඇස්තමේන්තු) | වාර්ෂික ඇස්තමේන්තු, ගිණුම්, වියදම් වාර්තා සහ අනෙකුත් වාර්තා සකස් කිරීම, දෙපාර්තමේන්තු සහ අනෙකුත් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ යටතේ ලැබෙන ප්‍රතිපාදන පාලනය සහ අධීක්ෂණය, මාසික වියදම් වාර්තා සහ අනෙකුත් වාර්තා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම. |

| කෙටි යෙදුම | සටහන | වගකීම් දරන ක්ෂේත්‍රය |
|---|---|---|
| ප්‍රා.වා.ඉංජි. | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු | ප්‍රාදේශීය මට්ටමේ අවශ්‍යතා සමඟ සම්බන්ධීකරණයෙන් ප්‍රාදේශීයව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්වල සමස්ත අධීක්ෂණය සහ කළමනාකරණය සිදු කිරීම, වාරිමාර්ග කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීයව තාක්ෂණික, මූල්‍ය සහ පරිපාලන කටයුතු පාලනය කිරීම, නිසි ජල කළමනාකරණයක් සහතික කරමින් කොට්ඨාශයේ වාරිමාර්ග කටයුතු මෙහෙයවීම සහ නඩත්තු කිරීම සඳහා කලාප වාරිමාර්ග අධ්‍යක්ෂකට සහාය වීම; සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වත්කම් නඩත්තු කිරීම සහ ආරක්ෂාව, කලාප වාරිමාර්ග අධ්‍යක්ෂකගේ මඟපෙන්වීම යටතේ සහ ප්‍රාදේශීය අවශ්‍යතා සැලකිල්ලට ගෙන වාරිමාර්ග කටයුතු සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය සැකසීමේදී කලාප වාරිමාර්ග අධ්‍යක්ෂකට සහාය වීම, අනුමත භෞතික හා මූල්‍ය වැඩසටහන්, සැලසුම් සහ ඉදිකිරීම් සැලසුම් අනුව කොට්ඨාශයේ වාරිමාර්ග වැඩ ඉදිකිරීමේ කටයුතු ගුණාත්මක බව සහතික කරමින් ක්‍රියාත්මක කිරීම, ස්ථාවරයන් සහ මාර්ගෝපදේශ අනුව සුළු හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග වැඩ කටයුතු විමර්ශනය කිරීම, ක්‍රම සැලසුම් හා සැලසුම් කිරීම සහ ඇස්තමේන්තු පිළියෙළ කිරීම, අනුමත ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් අවශ්‍ය අවස්ථාවල ඒකක ගාස්තු සකස් කිරීම, කලාප වාරිමාර්ග අධ්‍යක්ෂක ගේ මඟපෙන්වීම යටතේ සහ දෙපාර්තමේන්තු ක්‍රියා පටිපාටි සහ ප්‍රමිතීන්ට අනුව බාහිර ආයතනවල ව්‍යාපෘතිවල වාරිමාර්ග සංරචක ක්‍රියාත්මක කිරීම. |

## 1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රධාන අංශ

1 විමර්ශන,ක්‍රම සැලසුම් සහ සැලසුම් අංශය
2 ඉදිකිරීම් සහ සංවර්ධන අංශය
3 ක්‍රම කළමනාකරණ අංශය
4 ගංගාධර කළමනාකරණ අංශය
5 පාලන අංශය
6 මූල්‍ය අංශය

මීට අමතරව පහත සඳහන් අංශයන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ පවතී.

1 වැඩසටහන් කළමනාකරණ අංශය
2 කොන්ත්‍රාත් සහ ප්‍රසම්පාදන අංශය
3 අභ්‍යන්තර විගණන අංශය
4 පුහුණු , පර්යේෂණ සහාය සහ ක්‍රමවේද ප්‍රවර්ධන අංශය
5 වැඩ පොදු හා ගොඩනැගිලි අංශය
6 යන්ත්‍ර සහ යාන්ත්‍රික වැඩපල අංශය
7 වාරිමාර්ග අභ්‍යාස ආයතනය - ගල්ගමුව

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහයට කුඩා කාර්ය මණ්ඩලයක් සිටින අතර, ඔවුන් වැඩකටයුතු කළමනාකරණය සහ සම්බන්ධීකරණය කරනු ලබයි. මෙයට අමතරව අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් සහ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස නිල බලයෙන් සහභාගි විය යුතු රැස්වීම් වලට අදාළ ලියකියවිලි පවත්වාගෙන යාම සිදු කරනු ලබයි.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ වන කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල හා යාන්ත්‍රික කාර්යාල ඇතුළු ප්‍රාදේශීය කාර්යාලයන්හි පිහිටීම



## පරිච්ඡේදය 02 : ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1 විශේෂ ජයග්‍රහණ සහ ප්‍රගතිය

- වෙනත් වසරවලට සාපේක්ෂව වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව (282 වැය ශීර්ෂය) සඳහා 2025 වර්ෂයේදී වෙන්කර තිබූ අතර එයින් මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා ලද රු.මි. 8,520 ක ප්‍රතිපාදන යොදාගනිමින් 94% ක භෞතික ප්‍රගතියක්ද 94% ක මූල්‍ය ප්‍රගතියක්ද, සංවර්ධන ව්‍යාපෘති සඳහා ලද රු.මි. 10,755 ප්‍රතිපාදන යොදාගනිමින් 67% ක භෞතික ප්‍රගතියක්ද 48% ක මූල්‍ය ප්‍රගතියක්ද අත්කර ගැනීමට හැකිවිය.

#### 2.1.1 විමර්ශන, ක්‍රම සැලසුම් සහ සැලසුම් අංශය

- පාරිසරික අධ්‍යයන අංශය මගින් මුන්දෙනි ආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය සඳහා මහජනතාවගෙන් ලැබුන අදහස් සැලකිල්ලට ගනිමින්, පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවට අතිරේක වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, ව්‍යාපෘතිය සඳහා පාරිසරික අනුමැතිය ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය වන  මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලබා දී ඇත.එමෙන්ම පහළ මල්වතු ඔය ව්‍යාපෘතිය සඳහා පාරිසර කළමනාකරණ සැලැස්ම සකස්කිරීම සඳහා යෝජනා කැඳවා ඇත.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අදහස් සහ අනුමැතිය ලබා දීම සඳහා ඉදිරිපත් කරන ලද විවිධ රාජ්‍ය සහ පෞද්ගලික සංවර්ධන ව්‍යාපෘති වල (පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති, හෝටල් ව්‍යාපෘති ආදී) පාරිසරික බලපෑම් ඇගයීම් සහ මූලික පාරිසරික අධ්‍යයන වාර්තා 35 ක් පාරිසරික අධ්‍යයන අංශය මගින් ඇගයීමට ලක් කර ඇත.

- කුඩා ජල විදුලි ව්‍යාපෘති 31 ක් ඇගයීමට ලක් කර ඊට අදාළ නිර්දේශයන් ව්‍යාපෘති අනුමත කරන ආයතන වෙත හෝ ව්‍යාපෘති යෝජකයන් වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ අතරින් ව්‍යාපෘති 6ක් සඳහා අනුමැතිය සහ ව්‍යාපෘති 2ක් සඳහා මූලික එකඟතාව ප්‍රදානය කර ඇත.

- දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද සූර්ය බලශක්ති ව්‍යාපෘති / පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘති වාර්තා 22ක් පාරිසරික අධ්‍යයන අංශය මගින් ඇගයීමට ලක් කර ඊට අදාළ අනුමත කිරීම් හෝ අදහස් දැක්වීම් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත ලබා දී ඇති අතර සුළං බල ව්‍යාපෘති 3ක් ඇගයීමට ලක් කර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විරෝධතාවයක් නොමැති බව දන්වා ඇත. තවද විදුලි සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘති 2 ක් ඇගයීමට ලක් කර කොන්දේසි සහිත අනුමැතිය හා හෝටල් ව්‍යාපෘති 60 ක් ඇගයීමට ලක් කර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශ හෝ අදහස් ලබා දී ඇත.

- පාරිසරික අධ්‍යයන අංශය මගින් ගංගා වැලි කැණීම් බලපත්‍ර සඳහා සහ කුඩා ජල ව්‍යාපෘතිවල ස්ථාන පරීක්ෂාව සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශ නිකුත් කිරීමට මාර්ගෝපදේශයක් සකස් කර  දැනුවත් කිරීම සිදුකර ඇත.

- වැව් පතුල් වලින් රොන්මඩ ඉවත් කිරීම සහ මැටි/පස් ඉවත් කිරීම සඳහා අනුමැතීන් සහ කාලය දීර්ඝ කිරීම් 8 ක් ලබා දී ඇත. (නාගදීප වැව, ඇතිමලේ වැව, රොට්ට වැව, කරඳ ඔය, කනයන්කුලි කරඩි කුලම් වැව, වලතාපිටිය වැව, නවල් ආරු අමුණ, මහ අළුත්ගම ආර වැව).

- ගංගා වැලි කැණීම් සඳහා බලපත්‍ර ලබා දීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයෙන් සිදු කරන ලද ඉල්ලීම් වලින් 805 ක් සඳහා කලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් විසින් පහත පරිදි නිර්දේශ ලබා දී ඇත. එම ස්ථානවල භූ බංධාංක දත්ත පද්ධතියට ඇතුලත් කර ඇත.

| අනු අංකය | වාරිමාර්ග කලාපය | වාරිමාර්ග නිර්දේශ ලබා දුන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුරාධපුරය | 53 |
| 2 | කොළඹ | 102 |
| 3 | ත්‍රිකුණාමලය | 02 |
| 4 | මඩකලපුව | 67 |
| 5 | පුත්තලම | 23 |
| 6 | මොණරාගල | 182 |
| 7 | මන්නාරම | 46 |
| 8 | හම්බන්තොට | 0 |
| 9 | පොළොන්නරුව | 18 |
| 10 | මහනුවර | 161 |
| 11 | කුරුණෑගල | 24 |
| 12 | අම්පාර | 126 |
| 13 | බදුල්ල | 01 |
| 14 | ගාල්ල | 0 |

- ඉඩම් පදනම් කරගත් වැලි ගොඩදැමීමේ ව්‍යාපෘති නැගෙනහිර පලාතේ - 02, දකුණු පලාතේ -02, බස්නාහිර-04, සහ ඌව පලාතේ-01 සඳහා අනුමැතිය ලබාදී ඇත.

- වාරිමාර්ග දෙපාර්තෙමින්තුව නියෝජනය කරමින්,පාරිසරික අධ්‍යන අංශය මගින් ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ සහ රැස්වීම් 154 ක් (විෂයගත කිරීම, තාක්ෂණික ඇගයීම්, වැඩමුළු ආදිය) සිදු කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, වෙරළ සංරක්ෂණ හා සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, වනජීවී දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් අදාළ ආයතන සමඟ සහයෝගයෙන් විවිධ වර්ගයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා නිර්දේශ සහ අනුමැතිය නිකුත් කිරීම මෙම ප්‍රයත්නවල අරමුණ විය.

- ජලශක්ති අංශය මගින් මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ, උතුරු මැද පළාත් ඇළට අදාළ කෝන්ගැටිය ජලාශයේ භෞතික ආකෘතිය ඉදිකරන ලද අතර, ආකෘති අධ්‍යන වාර්තාව එම ව්‍යාපෘතියට ඉදිරිපත් කර ඇත. එම ව්‍යාපෘතිය යටතේම, මාදැත්තාව ආකෘති අධ්‍යනය ආරම්භ කර එය දැනට ක්‍රියාත්මක කරමින් පවතී.

- තවද ගංගාධාර කළමනාකරණ අංශයේ ඉල්ලීම පරිදී දැදුරු ඔය ගං ඉවුර ආරක්ෂාව සහ ආකෘති අධ්‍යනය ජලශක්ති අංශය මගින් දැනට ක්‍රියාත්මක කරමින් පවතී.

- ලෝක බැංකු මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA) යටතේ ජලශක්ති පර්යේෂණාගාරයේ ප්‍රධාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කරන ලද අතර මෙම ව්‍යාපෘතිය මගින් ගෘහස්ත පර්යේෂණාගාරය, පරිගණක විද්‍යාගාරය, යාන්ත්‍රික වැඩපල සහ උපකරණ අංශය, මෙන්ම ජලශක්ති පර්යේෂණාගාරයේ විදුලි පද්ධතිය වැඩිදියුණු කිරීම් සඳහා පහසුකම් සපයන ලදී.

- ජලශක්ති පර්යේෂණාගාරයේ උපකරණ අංශය මගින් 2025 වර්ෂය තුළ අනුරාධපුර, ගාල්ල, වව්නියාව යන වාරි කලාප තුළ මට්ටම් ගැනීමේ උපකරණ 61 ක ප්‍රමාණයක් සහ Total Station එකක් අළුත්වැඩියා කර ක්‍රමාංකනය කරන ලදී.

- ඉංජිනේරු ද්‍රව්‍ය අංශය මගින් 2025 වර්ෂය තුල කොන්ක්‍රීට් කියුබ් සම්පීඩන පරීක්ෂාවන් (Compressive strength of test cubes) 9766 ක් ඇතුළුව රසායනාගාර පරීක්ෂණ19,091 ක් පමන සිදුකර ඇත.

- ඉංජිනේරු භූවිද්‍යා අංශය මගින් අළුත්දිවුල්වැව, මාගල්ලවැව, යාන්ඔය සෑදැල වේල්ල, ගිරිතලේ වැව, මාළුස්සාකැළේ සෑදැල වේල්ල, නැගෙනහිර පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ IWWRMP ව්‍යාපෘතිය සඳහා පරවිපංචන් යන වේළි වල ජල කාන්දු වන මාර්ග සහ දෝෂ හඳුනා ගැනීම සඳහා භූගත විද්‍යුත් ප්‍රතිරෝධක සමීක්ෂණ (Ground Electrical Resistivity Survey) පවත්වන ලදී. තවද, නුවර වැව, අළුත්දිවුල් වැව, කොටපත්දමන යෝජිත වේල්ල සඳහා භූ විද්‍යාත්මක පරීක්ෂණ සැලැසුම් කර සිදුකරණ ලදී. එමෙන්ම මාගල්ල වැවෙහි සොරොව්ව හරහා තිබූ ජල කාන්දුව නැවැත්වීම සඳහා මැටි/සිමෙන්ති දියර කැවීම හා ඉදිකරමින් පවතින පහළ මල්වතුඔය ජලාශ බැම්මෙහි පාදම සකස් කිරීම සඳහා වැව් බැම්මෙහි සිමෙන්ති දියර කැවීම වැනි භූ විද්‍යාත්මක ප්‍රතිකර්ම සිදුකරන ලදී.

- ඉඩම් පරිහරණ අංශය මගින් නුවරඑළිය වාරිමාර්ග කොට්ඨාශයට අයත් බෝලගන්දාවෙල, පරගහ අරාව, කීනවල, මුල්හාල් ඇළ ප්‍රදේශවල සහ  අනුරාධපුර තිසා වැව හා බසවක්කුලම වැව ආශ්‍රිත වගා බිම් ප්‍රදේශවල ඉඩම් පරිහරණ අධ්‍යයනයක්  සිදුකර ඒ මගින් පාංශු සිතියම් සහ බෝග නිර්දේශ සිතියම් සකසන ලදී.  ඊට අමතරව  අනුරාධපුර, හම්බන්තොට හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල ප්‍රධාන හා මධ්‍ය ප්‍රමාණ වැව්වල  ජල තත්ව අධ්‍යයන සිදු කරන ලදී. තවද නිල්වලා ගඟ, ගිං ගඟ, මැණික් ගඟ, අත්තනගලු ඔය, කැළණි ගඟ හා  මල්වතු ඔය ඇතුළු ගංගා කිහිපයක් සඳහා ජල තත්ත්ව අධ්‍යයන සිදු කරන ලදී.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 125 වන සංවත්සරයට සමගාමීව කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වයෙන් අප්‍රිකා සහ ආසියාතික රටවල් සඳහා වන කලාපීය ඒකාබද්ධ බහු - උපද්‍රව පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියේ (RIMES) සිව්වන අමාත්‍ය මණ්ඩල සමුළුව ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍ය, සෞදි අරාබිය , නේපාලය, අප්‍රිකානු හා ආසියාතික රටවල් 40 ක සහභාගීත්වයෙන් මැයි මස 6 සිට 9 දින දක්වා කොළඹදී පැවැත්විණි. මෙම ආයතනය මගින් අප්‍රිකා සහ ආසියාතික රටවල් මූලික වශයෙන් මුහුණපා ඇති කාළගුණ හා දේශගුණික අවධානම් තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම,සංනිවේදනය කිරීම හා තීරණ ගැනීම සඳහා එම අවධානම් පිළිබඳ තොරතුරු යෙදවීම යන පහසුකම් සැලසීම සඳහා කලාපීය ඒකාබද්ධ බහු - උපද්‍රව පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය (RIMES) පිහිටුවා ඇත.

- ව්‍යාපෘති සැලසුම් අංශය මගින් හම්බන්තොට කලාපයේ කිරම ඔය වාරිමාර්ග පද්ධතියේ ධාරිතාව වැඩිකිරීම සඳහා එම නිම්නයේ අතු ගංගාවක් වන පුස්වැල්දොල ආර හරහා නිර්මිතයක් ඉදිකිරිම සම්බන්ධව පූර්ව ශක්‍යතා අධ්‍යයනය මේ වන විට අවසන් අදියරේ පවත අතර රාජාංගන ජලාශයේ සිට පුත්තලම කලාපයේ පහාරිය ජලාශය හා එම නිම්නයේ තවත් කුඩා වැව් 05ක් සඳහා ජලය සැපයීමට අන්තර් නිම්න ඇල මාර්ගයක් ඉදිකිරීමට ඇති හැකියාව අධ්‍යයනය කර ඇත.

- මඩකලපුව කලාපයේ යෝජිත කන්ඩියනාරු අතු ගංගාව හරහා ජලාශයක් ඉදිකර උන්නච්චි වාරිමාර්ග පද්ධතිය පුළුල් කිරීමේ හැකියාව,පුත්තලම කලාපයේ තම්මැන්නා ඇල වාරිපද්ධතියේ ගැටළු අධ්‍යයනය කර එම පද්ධති ධාරිතාවය පුළුල් කිරීම සහ අම්පාර පන්නල්ගම ජලාශයේ ජල ඌනතාවයට පිලියමක් ලෙස යාබද නිම්නයෙන් අන්තර්නිම්න ඇලමාර්ගයක් මගින්ජලය ලබාගෙන එම වාරිමාර්ග පද්ධතිය පුළුල් කිරීමේ හැකියාව අධ්‍යයනය කිරීම අරඹා ඇත.

- නිර්මාණ අංශය මගින් අනුරාධපුර - හුරුළුවැව වාරිමාර්ග කොට්ඨාශයේ ඇති අලුත්දිවුල්වැව සොරොව්ව කැඩීයාම හේතුවෙන් ඒ සඳහා නව සොරොව්වක් නිර්මාණය කිරීම කරන ලද අතර අනුරාධපුර - ගල්කඩවල වාරිමාර්ග පද්ධතියේ පවතින ගැටළු හා ඉහල ජලාධාර ප්‍රදේශයේ යටවීම වැළැක්වීම සඳහා සුදුසුවන පරිදි එම අමුණු ධාරිතාවය පුළුල් කිරිම සඳහා වන නිර්මාණ කටයුතු සිදුකරමින් පවතී.

- එමෙන්ම කොළඹ කලාපයේ කැළණි ගඟ සුළු ගංවතුර පාලනය සඳහා හේවාගම ගංවතුර පාලන නිර්මිතයේ ධාරිතාවය පුළුල්කර නිර්මාණය කිරීම කරමින් පවතින අතර කැළණි ගඟ සුළු ගංවතුර පාලනය සඳහා හේවාගම ගංවතුර පාලන නිර්මිතයේ ධාරිතාවය පුළුල්කර නිර්මාණය කිරීම අවසන් කර ඇත.

- පුත්තලම කලාපයේ ඇති බැම්ම බිඳීගිය මහසෙන් වැව, බැම්ම හා අනුබද්ධ නිර්මිත නිර්මාණය කිරීම මෙන්ම අම්පාර කලාපයේ - පොතුවිල් වාරිමාර්ග කොට්ඨාශයේ රදැල්ල ජලාශයේ ජල ඌනතාවයට විසඳුමක් ලෙස හැඩ ඔය හරහා අමුණක් හා පෝෂිත ඇල මාර්ගය නිර්මාණය කිරීම අවසන් කර ඇත.

- ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ අංශය මඟින් 2025 වර්ෂය තුළ රටේ ප්‍රධාන ගංගා පද්ධති ආශ්‍රිතව ඇතිවූ ගංවතුර සිද්ධීන්ට ප්‍රතිචාර දක්වමින් ගංවතුර සිද්ධීන් 23ක් සඳහා ගංවතුර පූර්ව අනතුරු ඇඟවීම් 60ක් ආපදා කළමනාකරණය පිළිබඳව වගකිවයුතු ආයතනවලට, නිලධාරීන්ට සහ මහජනතාවට නිකුත් කරන ලදී. මෙම අනතුරු ඇඟවීම් මහවැලි ගඟ, දැදුරු ඔය, කළු ගඟ, අත්තනගලු ඔය, ගල් ඔය, යාං ඔය, මහ ඔය, කැලණි ගඟ, මැණික් ගඟ, කුඹුක්කන් ඔය, මුන්දෙනි ආරු සහ කලා ඔය ඇතුළු ප්‍රධාන ගංගා 18ක් සඳහා නිකුත් කරන ලදී. ඒ අතරින් දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ තිව්‍ර ගංවතුර තත්ත්වයන් සම්බන්ධයෙන් අනතුරු ඇඟවීම් 55ක් නිකුත් කරන ලද අතර, එය ජනතාවගේ ආරක්ෂාව සහතික කිරීම හා ආපදා අවම කිරීම සඳහා අදාළ අංශ වලට කඩිනම් සේවයක් සැපයීමට උපකාරී විය.

- එමෙන්ම ජල මිනුම් දත්තවල වල නිරවද්‍යතාව සහ විශ්වසනීයභාවය පවත්වා ගැනීම සඳහා, පවතින Rating Curves වල නිරවද්‍යතාව තහවුරු කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා, අඩු, සාමාන්‍ය සහ අධි ගංවතුර ප්‍රවාහ තත්ත්වයන් යටතේ මිනුම් කටයුතු 106ක් (Current Metering) විවිධ මිනුම් මධ්‍යස්ථානවල සිදුකරන ලද අතර ජල විද්‍යා හා ආපදා කළමනාකරණ අංශය විසින් එකතු කර සකස් කර සංරක්ෂණය කරන ලද ජල විද්‍යාත්මක දත්ත, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පමණක් නොව ජල සම්පත් සංවර්ධනය හා සැලසුම් කටයුතු වල නිරත අනෙකුත් රාජ්‍ය ආයතන, උපදේශකවරුන්, අධ්‍යාපනික සහ පර්යේෂණ ආයතනවල පෞද්ගලික උපදේශකවරුන්/ ආයතන 54කට සහ ශිෂ්‍යයන් 83 දෙනෙකුට අධ්‍යාපනික කටයුතු සඳහා දත්ත නිකුත් කර ඇත.

- තවද ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන Climate Resilience Multi-Phase Programmatic Approach (CResMPA) වැඩසටහන යටතේ, ජල විද්‍යා හා ආපදා කළමනාකරණ අංශය විසින් මිනුම් මධ්‍යස්ථාන 7ක ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීම සාර්ථකව නිම කරන ලද අතර ශ්‍රී ලංකාවේ ගංගා 22ක් ආවරණය වන පරිදි හරස්-කඩ (Cross-section) සමීක්ෂණ සිදු කිරීම, ගංවතුර අවදානම් සහිත ගංගා පද්ධති සඳහා LiDAR සමීක්ෂණ ක්‍රියාත්මක කිරීම, ගංගා පද්ධති 22ක් සඳහා ගංවතුර අනාවැකි ආකෘති (Flood Forecasting Models) සංවර්ධනය කිරීම, ජලාශ සඳහා ස්වයංක්‍රීය ජල මට්ටම් මිනුම් උපකරණ 40ක් ස්ථාපනය කිරීම, නව ස්වයංක්‍රීය ජල විද්‍යා මධ්‍යස්ථාන 100ක් ස්ථාපනය කිරීම සහ ගංවතුර නිරීක්ෂණ හා මෙහෙයුම් මධ්‍යස්ථානයක් (Flood Monitoring and Operations Room) ඉදිකිරීම සඳහා අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලියද සාර්ථකව අවසන් කරන ලදී.

- ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ අංශය මඟින් 2024 වර්ෂයේ මිලදී ගත් ඩ්‍රෝන යන්ත්‍ර භාවිතා කරමින්, 2025 වර්ෂය තුළ ගංවතුර නිරීක්ෂණය, සිතියම්ගත කිරීම සහ භූ-තොරතුරු විශ්ලේෂණ කටයුතු සඳහා LiDAR සමීක්ෂණ 9ක් සිදු කරන ලදී.

- තොරතුරු, සන්නිවේදන තාක්ෂණ හා භූගෝලීය තොරතුරු තාක්ෂණ අංශය මගින් සකස්කර ඇති භූ ගෝලීය තොරතුරු (GIS) දත්ත පද්ධතියට වගා බිම් ප්‍රමාණ, ඇළ පද්ධති, ජල පෝෂක ප්‍රදේශ, අමුණු දත්ත, සොරොව්, වාන්, වැව් බැම් වැනි ප්‍රධාන දත්ත ඇතුලත් කර ඇති අතර ජල විද්‍යාත්මක දත්ත සියල්ල ඒකාබද්ධ කිරීම තුලින් කාර්යක්ෂම ජල සම්පත් කළමනාකරණයක් සඳහා මග පාදනු ලැබේ. මෙම භූ ගෝලීය තොරතුරු දත්ත මගින් මුළු වගා කළ හැකි ප්‍රදේශ තක්සේරු කිරීමට සහ වාරි පද්ධති සැළසුම් වැඩි දියුණු කිරීමට උපකාරී වන අතර භූ ගෝලීය තොරතුරු දත්ත මගින් ඇළ මාර්ග පද්ධති නිරීක්ෂණය කිරීමට සහ ජල කළමනාකරණයට අවශ්‍ය දත්ත ලබාගැනීමට මග පාදයි. තවද ජල පෝෂක ප්‍රදේශ වලින් ලබා ගන්නා වර්ශාපතන හා ගංගා ජල මට්ටම් පිළිබඳ දත්ත ගංවතුර පාලනය සඳහා වැදගත් වේ.

- ජල සම්පත් සැලසුම් අංශය මගින් මහ ඔය උප ද්‍රෝණිය සඳහා HEC-HMS භාවිතයෙන් ජල විද්‍යාත්මක ආකෘති නිර්මාණ වාර්තාවක් සකස්කරන ලද අතර රත්නපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන ඇති Dry Dam System ව්‍යාපෘතිය සම්බන්ධ වාර්තාවක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

- එමෙන්ම ජල සම්පත් සැලසුම් අංශය මගින් යෝජිත හම්බන්තොට ප්‍රාදේශීය ව්‍යුහ (structure plan) සැලැස්ම සඳහා ජල සැපයුම පිළිබඳ මූලික විශ්ලේෂණ වාර්තාව සහ මඩකලපුව ප්‍රදේශයට බලපාන ගංවතුර අවම කිරීමට දායකවන මුන්දෙනි ආරු ගංගා ද්‍රෝණිය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති හා අධ්‍යයන පිළිබඳ වාර්තාව ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

- ජල සම්පත් සැලසුම් අංශය මගින් කලා ඔයේ එළුවන්කුලම ප්‍රදේශයෙන් ගංගා ජලය ලබා ගැනීම සඳහා වන අධ්‍යයන වාර්තාවක් සහ හම්බන්තොට සංවර්ධන ප්‍රදේශයට ජලය සැපයීමට හා කළු ගඟ ද්‍රෝණියේ ගංවතුර පාලනය සඳහා ඇති ජල සම්පත් සංවර්ධන යෝජනා පිළිබඳව වාර්තාවක් සකස් කරන ලදී.

- නාගහදොළ කුඩා ජල විදුලි ව්‍යාපෘතියට අනුමැතිය ලබා දෙන ලද වාර්තාව සහ තවත් යෝජිත විදුලිබල ව්‍යාපෘති 16ක් සඳහා අනුමැතිය ලබා දෙන ලද වාර්තා සකස්කර ඉදිරිපත් කිරීමද ජල සම්පත් සැලසුම් අංශය මගින් සිදු කර ඇත.

### 2.1.2 ක්‍රම කළමනාකරණ අංශය

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රධාන වැව් හා ජලාශයන්ට අයත් සීමාවන් අනවසර ක්‍රියාකාරකම්වලින් තොරව පවත්වාගෙන යෑම සඳහා, වැව් හා ජලාශවලට අයත් සීමාවන් ඕනෑම පාර්ශවයකට පැහැදිලිව හඳුනා ගත හැකි වන පරිදි භූමියෙහි සලකුණු කිරීම කාලීන අවශ්‍යතාවක් බව හඳුනා ගෙන ඒ අනුව, වැව් වල මායිම් භූමියේ සලකුණු කිරීම සඳහා වාරිමාර්ග ආඥාපනතේ පවතින නෛතික ප්‍රතිපාදනයන් ප්‍රකාරව සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ද සහිතව එම කටයුතු සැලසුම් කරන ලදී. ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ හඳුනාගත් ප්‍රධාන වැව් 21ක මායිම් භූමියේ සලකුණු කිරීම 2025 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර, ඒ අතුරින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවර වැවෙහි සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්ස වැවෙහි සීමාවන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ගල් යොදා භූමියේ සලකුණු කිරීම අවසන් කර ඇත. අනෙකුත් වැව්වල සීමාවන් සලකුණු කිරීම සිදු කරමින් පවතින අතර, මෙම වැඩපිළිවෙල අඛණ්ඩව ඉදිරියට සිදු කරනු ඇත.

- 2024/25 මහ කන්නය ආරම්භයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ජලාශවල ජල ධාරිතාවය 28% ක් විය. 2024/25 මහ කන්නය සඳහා වගා කිරීම ආරම්භ කළ අතර මුළු බිම් ප්‍රමාණයෙන් 94% ක් සාර්ථකව වගා කරන ලදී. 2025 යල කන්නය ආරම්භයේදී ජලාශවල ධාරිතාවය 87% ක් වූ අතර නිසි කළමනාකරණය හේතුවෙන් 87% ක භූමි ප්‍රමාණයක් සාර්ථකව වගා කිරීමට හැකි විය.

- 2025 යල කන්නයේ වගාවෙන් පසු ජලාශ වල ඉතිරිව තිබූ ජලය භාවිතා කරමින් 3 වන කන්නය සඳහා අතිරේක භෝග හෙක්ටයාර 11,847ක් වගා කිරීමට හැකි විය. 2024/25 වසර සඳහා වගා තීව්‍රතාවය අදාල ව්‍යාපාර තුල 185 % ක් ලෙස වැඩි කිරීමට හැකි විය.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන සේනානායක සමුද්‍රයෙන් සහ දැදුරු ඔය ජලාශයෙන් පමණක් ජල විදුලිය සඳහා ජලය මුදාහරින අතර පිළිවෙලින් ජලය ඝන මීටර් මිලියන 895 සහ 180ක ප්‍රමාණයක් එම ජලාශ වලින් ජල විදුලි උත්පාදනය සඳහා 2025 වසර තුල යොදාගෙන ඇත.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් පානීය ජල අවශ්‍යතාවයන් ඇතුළු අනෙකුත් අවශ්‍යතා සඳහා ප්‍රධාන ජලාශ වලින් වසරකට ජලය ඝන මීටර් මිලියන 250 හා මධ්‍යම පරිමාණ ජලාශ වලින් වසරකට ඝන මීටර් මිලියන 120 ලබා ගැනීම සඳහා අනුමැතිය ලබාදී ඇති අතර ගංගා හෝ අතු ගංගා මගින් ජලය ඝන මීටර් මිලියන 780 ප්‍රමාණයක් වසරකදී ලබා ගැනීමට අනුමැතිය ලබා දී ඇත.

- ප්‍රධාන ඇල මාර්ග කි.මී. 3577 ක්, අතු ඇල මාර්ග කි.මී. 913 ක්, වැව් බැම් කි.මී. 994 ක්, කෙත් ඇල මාර්ග කි.මී. 1791 ක් හා අපවහන ඇල මාර්ග කි.මී. 3166 ක් අතරින් තෝරාගත් ස්ථානවල මෙහෙයුම් හා නඩත්තු කටයුතු යටතේ 2025 වර්ෂයේදී වෙන් කර ඇති ප්‍රතිපාදන රු. මි. 1,695.3 න් 99.7% ක මූල්‍ය ප්‍රගතියක් සහිතව අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු එක් එක් කලාප යටතේ පහත පරිදී අවසන් කර ඇත.

| කලාපය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන 2025 (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) |
|---|---|---|---|
| අම්පාර | 18 | 239.41 | 238.77 |
| අනුරාධපුර | 100 | 215.26 | 215.26 |
| බදුල්ල | 19 | 78.00 | 77.84 |
| මඩකලපුව | 10 | 114.14 | 114.14 |
| කොළඹ | 28 | 53.50 | 53.16 |
| ගාල්ල | 15 | 70.05 | 68.98 |
| හම්බන්තොට | 24 | 162.65 | 162.65 |
| නුවර | 34 | 103.20 | 101.89 |
| කුරුණෑගල | 26 | 104.10 | 103.89 |
| මන්නාරම | 10 | 106.00 | 105.75 |
| මොනරාගල | 35 | 81.78 | 80.70 |
| පොළොන්නරුව | 12 | 176.00 | 175.87 |
| පුත්තලම | 14 | 66.90 | 66.20 |
| ත්‍රිකුණාමලය | 09 | 124.29 | 124.29 |
| **එකතුව** | **354** | **1695.3** | **1689.4** |

- වාරි හා ඵලදායීතා ප්‍රවර්ධන අංශය මගින් සේවාලාභීන් වන ගොවි ප්‍රජාව වෙත වඩාත් කාර්යක්ෂම සේවාවන් සැපයීම උදෙසා ලංකාව පුරා විහිදී ක්‍රියාත්මක කරනු ලබන ඒකක කාර්යාල 224 මගින් අදාළ ව්‍යාපාර කළමනාකරණ කටයුතු සිදුකරනු ලබන අතර, එයින් 2025 වර්ෂයේදී ඒකක කාර්යාල 28 ක් වැඩිදියුණු කිරීම සිදුකරන ලදී. එමෙන්ම ගොවීන් හා ව්‍යාපාර කළමනාකරුවන්ගේ දැනුම කුසලතා සහ ආකල්ප වැඩිදියුණු කිරීමේ අරමුණින් පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 11ක් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී.
- කරදිය හා ගංවතුර අවදානම ඇති කුඹුරු ඉඩම්වල පාරම්පරික මා වී වගාව ප්‍රචලිත කිරීමේ නියමු ව්‍යාපෘතියක් දෙද්දුව සහ රන්තොටුවිල ව්‍යාපාරවල ක්‍රියාත්මක කරන ලදී. මා වී වගාව ආකෘතියක් ලෙස දේද්දුව ව්‍යාපාරයේ සුළු බිම් ප්‍රමාණයක (පර්.20) බෙන්තොට වී පර්යේෂණ ආයතන පරිශ්‍රයේ සිදුකරන ලදී. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට වසර 125 ක් පිරීම නිමිත්තෙන් 2025 වර්ෂයට අදාලව යාවත්කාලීන කරන ලද වප් හවුල වැඩසටහන යටතේ ඇති වාරි ව්‍යාපාර වල තොරතුරු ඇතුලත් ග්‍රන්ථයක් වාරි හා ඵලදායීතා ප්‍රවර්ධන අංශය මගින් පළ කරන ලදී.

- පුහුණු අංශය මගින් සියළු සේවා කාණ්ඩවල බඳවා ගැනීමේ පටිපාටිවලට අනුකූලව විභාග පැවැත්වීමට පහසුකම් සැපයීම සම්බන්ධීකරණය කිරීම කරන අතර පූර්ව සේවා සහ සේවාස්ථ පුහුණු කාර්යක්ෂමතා කඩයිම් විභාග, තාක්ෂණික විභාග (ප්‍රායෝගික) හා නිල ආරම්භක පුහුණු වැඩසටහන් පුහුණු අංශය සමග සම්බන්ධව ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයේදී පවත්වනු ලැබේ.

- දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ කෙටිකාලීන පාඨමාලා හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා, විද්‍යාපති, දර්ශනපති සහ ආචාර්ය උපාධි ඇතුළු දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම පුහුණු අංශය මගින් සිදුකරන අතර 2025 වසර තුල පවත්වන ලද විභාග, පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර 6.3 පරිච්ඡේදයේ දක්වා ඇත.

- ජල සම්පත් කළමනාකරණය ඇතුළු වාරිමාර්ග ක්ෂේත්‍රයේ පුහුණු කිරීම් සඳහා පිහිටුවා ඇති ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය මගින් වාරිමාර්ග ඉංජිනේරුවරුන්,ඉංජිනේරු සහකාරවරුන්, සැළසුම් ශිල්පීන් හා ගබඩා භාරකරුවන් සඳහා සේවස්ථ පුහුණු වැඩමුළු 10 ක් පැවැත්වූ අතර ඉංජිනේරු සහකාරවරුන්, සැළසුම් ශිල්පීන් හා තාක්ෂණික සහකාරවරුන් සඳහා තාක්ෂණික පරීක්ෂණ හා කාර්යක්ෂමතා කඩයිම් විභාග 10 ක් පවත්වා ඇත.මීට අමතරව බාහිර ආයතන සඳහා පුහුණු වැඩමුළු 07 ක් පවත්වා ඇත.

### 2.1.3 ගංගාධර කළමනාකරණ අංශය

- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව වාරිමාර්ග විෂයපථයට අදාලව මුළු රටම ආවරණය වන පරිදි ජල සම්පත් සැලසුම් කිරීමේ කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් සිදුකළ අතර පළාත් සභා පිහිටුවීමෙන් පසු අන්තර් පළාත් ගංගා ද්‍රෝණි කළමනාකරණ කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි. ඒ හා සම්බන්ධ විශේෂඥ දැනුම හිමි ආයතනයන් ලෙස ප්‍රධාන ගංගා ද්‍රෝණි 103 ට අදාලව අවශ්‍ය අවස්ථා වල මැදිහත් වීම සහ උපදෙස් ලබා දීම සම්බන්ධයෙන් කටයුතු කිරීම 2018 වර්ෂයේ පිහිටුවන ලද ගංගාධර කළමනාකරණ අංශය මගින් සිදුකරනු ලබයි. දැනට අන්තර් පළාත් ගංගාවන්හි භෞතිකමය වෙනස්වීම්, ගංගා ඉවුරු ආරක්ෂණය, ගංගාවන්හි පිරිසිදුකම හා ආරක්ෂාව සඳහා ප්‍රජාව දැනුවත් කිරීම, පවතින ප්‍රතිපාදන සීමාවන් තුල එම අංශය මඟින් ඉටුකරනු ලබයි.

- ගංගාධර කළමනාකරණ අංශය මගින් ප්‍රධාන ගංගාවල මැණුම් කටයුතු සිදු කිරීම තුළින්, ගංගා පතුල මට්ටමෙහි වෙනස් වීම පිළිබඳව අධ්‍යයනය කිරීමත්, ඒ තුළින් මුහුදු මට්ටමට වඩා ගංගා පතුල පහත වැටීම වැලැක්වීම සඳහා ගංගා තුලින් වැලි ගොඩ දැමීම වරින් වර තහනම් කිරිමට ක්‍රියාමාර්ග ගන්නා අතරම, භූ විද්‍යා හා පතල් කාර්යංශය ඇතුළු ඊට අදාළ ආයතනන දැනුවත් කිරීමද සිදු කරයි.

- එමෙන්ම ගංගාධර කළමනාකරණ අංශය මගින් දැනටමත් ගංගාවන් පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම සඳහා 'Clean River Programme' වැය ශීර්ෂය යටතේ හඳුනාගත් ප්‍රමුඛතා අයිතමයන් ක්‍රියාත්මක කිරීමට අදාළ වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල දැනුවත් කිරීමත් සිදු කරනු ලබන අතර ගංගා ද්‍රෝණි කළමනාකරණය සඳහා ප්‍රාදේශීය මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් සකස් කරමින් පවතී.
- ගංගාධර කළමනාකරණ අංශය මගින් ප්‍රතිපාදන ලබාදීමෙන් ත්‍රිකුණාමලය කලාපයේ කන්තලේ කොට්ඨාසයේ ජනරංජන ව්‍යාපාරයේ අක්කර 1000 පමණ කුඹුරු ප්‍රමාණයකට මහවැලි ගඟෙහි ගංවතුරින් සිදුවන හානි වැළැක්වීමට මීටර් 150ක පමණ ගංවතුර ආරක්ෂණ වැටි වැඩිදියුණු කිරීමටත්, කන්තලේ වැවෙහි පිටවානෙන් ජලය ගලාබස්නා මාර්ගයේ තිබූ බාධක කි.මී. 3 පමණ දුරකට ඉවත්කර කුඹුරු අක්කර 12,000 ක් පමණ ආරක්ෂා කිරීමටත්, දැදුරු ඔයේ මෝය කට ආසන්නයේ පිහිටි ආර්ථික වටිනාකමින් ඉහළ ප්‍රදේශයක ප්‍රවේශ මාර්ගය දැදුරුඔය බාධනය වීම හේතුවෙන් භාවිතා කළ නොහැකි ලෙස අබලන් වී පැවති බැවින් එය ගල් වැටි දමා පිළිසකර කර දීම සිදු කරන ලද අතර මඩකලපු දිස්ත්‍රික්කයේ වව්ච්චේනි ප්‍රවේශ මාර්ගය හා ඇළ මාර්ගය ආරක්ෂා කිරීම සඳහා ගල්වැටි දැමීමක් සිදු කිරීම මගින් ගම්මාන තුනකට ප්‍රවේශ මාර්ගය සැපයෙන අතර කුඹුරු අක්කර 3000ක් පමණ ආරක්ෂා වේ.

- ජල අපවහන හා ගංවතුර පද්ධති අංශය මගින් කොළඹ, ගාල්ල, හම්බන්තොට, සහ ත්‍රිකුණාමළය කලාප වල පිහිටි ජලාපවහන ව්‍යාපෘති වල (Drainage scheam) අත්‍යවශ්‍ය මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා ප්‍රතිපාදන ලබා දෙන අතර මේ යටතේ ජලාපවහන ව්‍යාපාර 30 තුල වැඩ යෝජනා 180 ක් ඉටුකරණ ලදී.

- කැළණි ගඟ ගංවතුර ආරක්ෂණ බැම් ප්‍රතිසංස්කරණ කිරීමේ ව්‍යාපෘතිය, මා ඔය, අත්තනගලු ඔය හා බෙන්තර ගඟ ගංවතුර ආරක්ෂණ පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති වල ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා තෝරාගත් මහා වාරිමාර්ග ව්‍යාපෘති වල අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු (ERIMIS) වැය විෂය මගින් ප්‍රතිපාදන සපයා ගැනීමෙන් පසු ඉටුකර ඇත.

### 2.1.4 ඉදිකිරීම් සහ සංවර්ධන අංශය

- විශාල ඉදිකිරීම් අංශය මගින් ක්‍රියාත්මක කරන පහළ මල්වතුඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2025 වර්ෂයේදී ප්‍රතිපාදන වෙන් වුවත් එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය(කල් දිගු ලබා ගැනීම හා සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුව සඳහා) කැබිනට් අනුමැතියන් ලැබීම 2025 දෙසැම්බර් මස 23 දින දක්වා පමාවීම නිසා අපේක්ෂිත ප්‍රගතිය ලඟාකරගත නොහැකි විය

- තවද විශාල ඉදිකිරීම් අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය(කල් දිගු ලබා ගැනීම හා සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුව සඳහා) කැබිනට් අනුමැතියන් 2025 මැයි මස 28 දින ලැබී ඇති අතර එහි ඉතිරි කාර්යයන් සඳහා අවශ්‍ය වූ රු.මි. 2,000ක ප්‍රතිපාදන පහළ මල්වතුඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන වලිනින් මාරු කරගැනීමටද සිදු වීම නිසා අපේක්ෂිත ඉලක්ක කරා ලගාවිය නොහැකි වී ඇත.

- ඉදිකිරීම් හා සංවර්ධන අංශය මගින් සිදුකරනු ලබන ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතිය “මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති” යටතේ දක්වා ඇත.

### 2.1.5 යන්ත්‍ර සහ යාන්ත්‍රික වැඩපල අංශය

- යන්ත්‍ර හා යාන්ත්‍රික අංශය මගින් දෙපාර්තමේන්තුව සතු පරිහරණය කරන සියලුම වාහන සඳහා 2025 වර්ෂය තුල පූර්ණ රථවාහන රක්ෂණාවරණය සිදු කර ඇති අතර යාන්ත්‍රික වැඩපල මගින් වාහන හා යන්ත්‍ර අලුත්වැඩියාවන් ඇතුළුව වැඩ 3520 ක ප්‍රමාණයක් නිමකර ඇත.තවද බාජ් සමග **12T** ක්‍රෝලර් එක්ස්කැවේටර් 02ක්**,** මිනි එක්ස්කැවේටර් 03ක් හා බාජ් 01 ක් මිලට ගෙන ක්ෂේත්‍ර සේවය සඳහා යොදවා ඇති අතර 2025 වර්ෂය ආරම්භයේ පැවති වාහන අනතුරු 54 න් 20 ක් සම්න්ධයෙන් මු.රෙ. අනුව කටයුතු කර අවසන් කර ඇත.

### 2.1.6 වැඩපොළ හා ගොඩනැගිලි සේවා අංශය

- වැඩපොළ හා ගොඩනැගිලි සේවා අංශය මගින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට වසර 125 පිරීමට සමගාමීව දෙපාර්තමේන්තු ශ්‍රවනාගාරය සහ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ රුස්වීම් ශාලාවේ නවීකරණ කටයුතු සිදුකිරීම මෙන්ම ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ සහ පිටත වැඩිදියුණු කිරීම් හා ප්‍රතිසංස්කරණ කටයුතු රාශියක් සිදුකරණ ලදී.

### 2.1.7 කලාප කාර්යාල

- දිට්වා සුළි කුණාටු අවස්ථාවේ කුරුණෑගල කලාපයේ දැදුරු ඔය ජලාශය ඉතිහාසයේ මුහුණ දුන් දරුණුතම ජල ගැලීමට මුහුණ දුන් අතර දැදුරු ඔය ජලාශයේ ධාරිතාව මෙන් 10 ගුණයක පමණ ජල ධාරිතාවයක් කළමනාකරණය කරමින් ජලාශය ආරක්ෂිතව පවත්වාගනිමින් කටයුතු කරීමට සමත් වී ඇත

- පොළොන්නරුව කලාපයෙහි පරාක්‍රම සමුද්‍රයේ ජලය නිසියාකාරව කළමනාකරණය කිරීම හේතුවෙන් දිට්වා සුළි කුණාටුව නිසා එම දිස්ත්‍රික්කයේ ඇතිවූ ගංවතුර අවධානම අවම කිරීමට හැකිවී ඇත.

- එමෙන්ම දිට්වා සුළි කුණාටුව හේතුවෙන් බිඳී ගිය ඇලහැර අමුණ කඩිනමින් තාවකාලිකව ප්‍රතිසංස්කරණය කිරීම හේතුවෙන් ඇලහැර, මින්නේරිය හා ගිරිතලේ ව්‍යාපාර වල මහ කන්නයේ ගෙවීමට නියමිතව තිබූ වගා හානි මිලියන 500 ක මුදල ඉතිරි වී ඇත.

- හම්බන්තොට කලාපයේ වීරකැටිය කොට්ඨාශයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 125 වන සංවත්සරයට සමගාමීව වසර 40 කට ආසන්න කාලයක් අක්‍රියව පැවතුණු මුරුතවෙල ජලාශයේ දකුණු ඇල ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම නිසා යල කන්නයේ අමතර කුඹුරු අක්කර 1300ක් පමණ වගා කිරීමට හැකිවී ඇති අතර හදිසි අවස්තා වලදී මුරුතවෙල ජලාශයෙන් කිරම ඔය ව්‍යාපාරයට ජලය ලබා දීමටද හැකියාව ඇත.

- ත්‍රිකුණාමලය කලාපයේ පිහිටා ඇති ජනරංජන වැවෙහි වැව් බැම්මේ දුරුවල වී තිබූ ප්‍රදේශ අලුත්වැඩියා කිරීම හා ආරක්ෂා කිරීම මගින් අක්කර 2,000 පමණ වගා කිරීමෙන් නිවාස 137 ක් පමණ හා ඒ ආශ්‍රිත මාර්ග ආරක්ෂා කර ගැනීමටත් හැකි වී ඇත.

**මහා පරිමාණ වැව් හා ජලාශයන්හි පැවති ධාරිතාවය, වගා තීව්‍රතාවය, වගා කරන ලද භූමි ප්‍රමාණය පිළිබඳ තොරතුරු**

| අනු අංකය | කලාපය | ජලාශය (මහා පරිමාණ) | වගා භූමි ප්‍රමාණය (අක්කර) | ධාරිතාවය (MCM) | වගා තීව්‍රතාවය | | | සම්පූර්ණ වගා තීව්‍රතාවය | 31/12/2025දිනට ජලාශ ධාරිතාවය (MCM) | පානීය ජලය ලබා ගැනීම සඳහා අවසර ලබා දීම (MCM/year) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2024-2025 මහ කන්නය | 2025 යල කන්නය | 2025 අතරමැදි කන්නය | | | |
| 1 | අම්පාර | අම්බලන් ඔය | 5,251 | 44.30 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 43.41 | - |
| 2 | | එක්ගල් ඔය | 2,501 | 29.00 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 27.51 | - |
| 3 | | නාමල් ඔය | 3,699 | 52.70 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 48.85 | - |
| 4 | | පල්ලන් ඔය | 3,499 | 115.60 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 66.24 | 0.37 |
| 5 | | පන්නල්ගම | 4,601 | 34.00 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 32.16 | - |
| 6 | | රඹකැන් ඔය | 2,246 | 56.10 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 35.43 | 8.21 |
| 7 | | රොට්ටිකුලම | 1,428 | 6.30 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 3.52 | - |
| 8 | | සේනානායක සමුද්‍රය | 120,204 | 949.80 | 0.95 | 0.97 | 0.00 | 1.92 | 525.96 | 8.76 |
| 9 | | කළුගල් ඔය | 1,124 | 10.10 | 0.81 | 0.81 | 0.00 | 1.62 | 8.51 | - |
| 10 | අනුරාධපුර | හුරුළු වැව | 10,400 | 67.80 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 66.18 | - |
| 11 | | මහකනදරාව | 6,101 | 44.70 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 41.51 | 2.45 |
| 12 | | මහවිලච්චිය | 2,664 | 40.10 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 36.58 | - |
| 13 | | මානන්කට්ටිය | 1,050 | 6.00 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 5.49 | - |
| 14 | | නාච්චාදූව | 7,000 | 55.70 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 49.86 | 0.01 |
| 15 | | නුවර වැව | 2,599 | 44.50 | 1.00 | 1.00 | 0.19 | 2.19 | 43.51 | 4.02 |
| 16 | | පදවිය | 8,700 | 104.80 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 103.61 | - |
| 17 | | රාජාංගන | 16,000 | 100.70 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 89.75 | - |
| 18 | | වාහල්කඩ | 1,999 | 53.00 | 1.05 | 1.05 | 0.00 | 2.10 | 53.04 | 3.29 |
| 19 | | යාන් ඔය | 14,922 | 169.00 | 0.72 | 0.70 | 0.00 | 1.42 | 158.19 | - |
| 20 | බදුල්ල | අඹේවෙල | 1,006 | 2.40 | 1.00 | 0.99 | 0.00 | 1.99 | 2.53 | 10.38 |
| 21 | | දඹරාව | 1,500 | 15.90 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 15.14 | - |
| 22 | | කන්දෙ ඇළ | 2,301 | 2.20 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 2.17 | 0.67 |
| 23 | | මාපාකඩ | 1,500 | 9.50 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 9.04 | - |
| 24 | | නාගදීප | 4,201 | 29.40 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 29.40 | - |
| 25 | | සොරබොර | 2,002 | 20.70 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 17.27 | - |
| 26 | | මොරාණ | 1,302 | 16.59 | 0.46 | 0.69 | 0.00 | 1.15 | 16.31 | - |
| 27 | මොණරාගල | නවකිරි | 18,399 | 65.40 | 1.00 | 0.90 | 0.00 | 1.90 | 55.31 | - |
| 28 | | රුගම් | 9,753 | 22.90 | 1.16 | 1.03 | 0.00 | 2.19 | 13.05 | 12.78 |
| 29 | | උන්නිච්චි | 15,389 | 67.90 | 1.07 | 0.80 | 0.00 | 1.87 | 57.26 | 0.09 |
| 30 | | වාහනේරි | 9,842 | 16.70 | 1.17 | 1.03 | 0.00 | 2.19 | 13.96 | 0.27 |
| 31 | හම්බන්තොට | බදගිරිය | 1,749 | 11.20 | 1.00 | 1.00 | 0.94 | 2.94 | 8.45 | - |
| 32 | | කැකිරිඔබඩ | | 2.69 | - | - | - | - | 1.69 | - |
| 33 | | ලුණුගම්වෙහෙර | 13,499 | 226.70 | 1.00 | 1.00 | 1.00 | 3.00 | 193.11 | 19.71 |
| 34 | | මච්ආර | 3,800 | 41.00 | 2.18 | 1.00 | 0.00 | 3.18 | 34.96 | - |
| 35 | | මුරුතවෙල | 4,426 | 48.00 | 0.95 | 0.95 | 0.00 | 1.91 | 38.92 | 2.01 |
| 36 | | රිදියගම | 8,498 | 32.10 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 27.63 | 12.78 |
| 37 | | තිස්සවැව | 2,750 | 4.30 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 2.22 | - |
| 38 | | වෙහෙරගල | | 75.24 | - | - | - | - | 59.57 | 3.65 |
| 39 | | විරවිල | 2,599 | 14.40 | 0.89 | 0.89 | 0.89 | 2.67 | 13.14 | - |
| 40 | | යෝධ වැව | 3,499 | 10.30 | 0.92 | 0.92 | 0.00 | 1.83 | 7.89 | - |

| අනු අංකය | කලාපය | ජලාශය (මහා පරිමාණ) | වගා භූමි ප්‍රමාණය (අක්කර) | ධාරිතාවය (MCM) | වගා තිව්‍රතාවය | | | සම්පූර්ණ වගා තිව්‍රතාවය | 31/12/2025දිනට ජලාශ ධාරිතාවය (MCM) | පානීය ජලය ලබා ගැනීම සඳහා අවසර ලබා දීම (MCM/year) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2024-2025 මහ කන්නය | 2025 යල කන්නය | 2025 අතරමැදි කන්නය | | | |
| 41 | ගාල්ල | ඇල්ලෙවෙල | 1,305 | 1.00 | 0.98 | 0.98 | 0.00 | 1.96 | 1.03 | - |
| 42 | | කැකණදුර | 1,100 | 2.80 | 0.50 | 0.59 | 0.00 | 1.09 | 2.53 | 0.91 |
| 43 | මහනුවර | දේවහුව | 3,000 | 13.60 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 12.13 | - |
| 44 | | නාලන්ද | | 15.86 | - | - | - | - | 14.66 | 1.10 |
| 45 | | වැමැඩිල්ල | 1,999 | 5.67 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 5.78 | - |
| 46 | කුරුණෑගල | අඹකොළ වැව | 840 | 8.26 | 1.00 | 1.00 | 0.24 | 2.24 | 6.52 | - |
| 47 | | අත්තරගල්ල | 1,035 | 4.50 | 1.00 | 0.58 | 0.19 | 1.77 | 3.27 | - |
| 48 | | බතලගොඩ | 7,635 | 5.97 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 3.92 | - |
| 49 | | දැදුරු ඔය | 6,499 | 75.20 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 57.37 | 12.96 |
| 50 | | හක්වටුනා වැව | 6,373 | 24.30 | 1.00 | 1.00 | 0.01 | 2.01 | 23.34 | - |
| 51 | | කිඹුල්වාන ඔය | 2,451 | 8.50 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 7.22 | - |
| 52 | | මැඩියාව | 1,441 | 3.20 | 1.00 | 0.01 | 0.00 | 1.01 | 3.13 | - |
| 53 | | මාගල්ල | 7,000 | 9.20 | 0.96 | 0.00 | 0.01 | 0.98 | 7.45 | 3.01 |
| 54 | | ජයවැව | 2,399 | 9.50 | 1.00 | 0.58 | 0.00 | 1.58 | 8.88 | - |
| 55 | | උස්ගල සියඹලන්ගමුව | 2,100 | 26.70 | 1.05 | 1.05 | 0.00 | 2.09 | 20.86 | 2.19 |
| 56 | මොණරාගල | ඇතිමලේ | 1,003 | 6.80 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 6.80 | - |
| 57 | | හඳපානාගල | 1,700 | 18.25 | 1.47 | 1.71 | 1.71 | 4.89 | 13.97 | - |
| 58 | | මුතුකණ්ඩිය | 1,999 | 30.30 | 0.95 | 1.00 | 0.00 | 1.95 | 30.35 | 1.10 |
| 59 | පොළොන්නරුව | ගිරිතලේ | 7,601 | 27.00 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 19.92 | - |
| 60 | | කවුඩුල්ල | 18,616 | 128.30 | 1.30 | 1.30 | 0.07 | 2.67 | 116.44 | 5.45 |
| 61 | | මින්නේරිය | 22,476 | 135.70 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 127.12 | 5.42 |
| 62 | | පරාක්‍රම සමුද්‍රය | 25,187 | 143.20 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 131.00 | 2.61 |
| 63 | පුත්තලම | ඉඟිනිමිටිය | 6,005 | 72.60 | 0.99 | 0.99 | 0.00 | 1.99 | 65.79 | 4.56 |
| 64 | | තබ්බෝව | 2,093 | 19.00 | 1.00 | 1.07 | 0.00 | 2.07 | 17.18 | - |
| 65 | ත්‍රිකුණාමලය | කන්තලේ | 18,560 | 140.60 | 1.00 | 1.00 | 0.05 | 2.05 | 127.20 | 8.21 |
| 66 | | මහදිවුල් වැව | 2,100 | 24.60 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 24.57 | 0.69 |
| 67 | | මොරවැව | 4,801 | 42.90 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 42.46 | - |
| 68 | | වෙන්ඩ්‍රාසන් | 1,749 | 25.00 | 1.00 | 1.00 | 0.28 | 2.28 | 18.97 | - |
| 69 | | වාන් ඇළ | 1,621 | 2.90 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 2.85 | - |
| 70 | මන්නාරම | පාවට්කුලම | 4,134 | 33.30 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 28.06 | - |
| 71 | | අකතිමුරුප්පු | 6,350 | 9.40 | 1.00 | 0.02 | 0.00 | 1.02 | 9.01 | - |
| 72 | | යෝධ වැව | 31,340 | 38.20 | 0.93 | 0.14 | 0.00 | 1.07 | 32.38 | - |
| 73 | | වියාදිකුලම් | 1,552 | 2.20 | 1.00 | 1.00 | 0.00 | 2.00 | 1.72 | - |

ඉහත සඳහන් මහා පරිමාණ ජලාශ වලට අමතරව මධ්‍ය පරිමාණ ජලාශ 161ක මුළු ධාරිතාවය 267MCM වන අතර මුළු වගා භූමි ප්‍රමාණය අක්කර 56,630ක් වේ. ඉන් 2024/25 මහ කන්නයේ අක්කර 54,514 ක්ද, 2025 යල කන්නයේ අක්කර 51,677 ක්ද වගා කරන ලදී.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත පරිදි සාරාංශගත කොට දැක්විය හැකිවේ.

**මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති**


| | | පිටු අංකය |
|---|---|---|
| 1. | යාන් ඔය ව්‍යාපෘතිය | 25 |
| 2. | ඇල්ලේවැව ජලාශය | 27 |
| 3. | මුන්දෙනිආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය (රුගම් කිතුල් ජලාශය) | 28 |
| 4. | ගොඩිගමුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම | 29 |
| 5. | උමා ඔය පහළ සංවර්ධන ව්‍යාපෘතිය | 30 |
| 6. | පහළ මල්වතු ඔය බහු කාර්යය සංවර්ධන ව්‍යාපෘතිය | 32 |
| 7. | ඒරු වැව - මහකනදරාව පෝෂිත ඇල ව්‍යාපෘතිය | 34 |
| 8. | මින්නේරිය, ගල්ඔය, හුරුළුවැව සහ රාජාංගනය වාරි යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | 35 |
| 9. | තෝරාගත් මහා වාරිමාර්ග ව්‍යාපෘති වල අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු (ERIMIS) | 36 |


ඉහත ව්‍යාපෘති අතරින් යාන් ඔය, ඇල්ලේවැව, මුන්දෙනිආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය, උමා ඔය පහළ සංවර්ධන ව්‍යාපෘතිය, ඒරු වැව - මහකනදරාව පෝෂිත ඇල ව්‍යාපෘතිය යන ව්‍යාපෘති අති. වා. ආ. ජ. (ඉදිකිරීම් හා සංවර්ධන) යටතේ ඇති විශාල ඉදිකිරීම් අංශය මගින් ක්‍රියාත්මක කරන අතර ගොඩිගමුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියද මින්නේරිය, ගල්ඔය, හුරුළුවැව සහ රාජාංගනය වාරි යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියද අති. වා. ආ. ජ. (ඉදිකිරීම් හා සංවර්ධන) යටතේ ඇති ප්‍රාදේශීය සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කෙරේ.

තෝරාගත් මහා වාරිමාර්ග ව්‍යාපෘති වල අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු අති. වා. ආ. ජ. (ක්‍රම කළමණාකරන) යටතේ ඇති භෞතික සම්පත් කළමණාකරන අංශය මගින් සිදුකෙරේ.

**වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වෙන වෙනත් ව්‍යාපෘති**


| | | |
|---|---|---|
| 1. | බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය | 37 |
| 2. | ඒකාබද්ධ ජලධාර හා සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) | 38 |
| 3. | දේශගුණික අවබලපෑම් - බහු පියවර වැඩසටහන් ක්‍රියාමාර්ග ප්‍රවේශය (CResMPA) | 39 |

## 1. යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තු ගත මුදල | රු.මි. 48,355.3 | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | අනුරාධපුර සහ ත්‍රිකුණාමලය |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය** | ඝන මීටර මිලියන 169<br>නව කුඹුරු ඉඩම් හෙක්ටයාර 1515 ඇතුළුව හෙක්ටයාර 8,700 |
| ව්‍යාපෘති කාලය | 2012-2026 | **ප්‍රතිලාභීන්** | පවුල් 9,000 |
| **කල් දිගු ලබාදීම්** | 2020 - 2026 | **කල් දිගු ලබා දීමට හේතු** | නියමිත පරිදි ව්‍යාපෘතිය අවසන් වී නොතිබීම |
| **ප්‍රතිපාදන 2025** | රු.මි. 2,350 | **2026 වසර සඳහා ප්‍රතිපාදන** | රු.මි. 1,000.00 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 43,525.89 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 98.75 |
| **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 1,569.42 | | |
| **2025 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන /දරන ලද වියදම** | • ඉස්සන්වැව නව වාරි ඉඩම් සංවර්ධනය කිරීම. | | රු.මි. 407.70 |
| | • ජයන්තිවැව පහළ නිම්න සංවර්ධනය කිරීම. | | රු.මි. 356.18 |
| | • දකුණු ඉවුර ඇළ යටතේ ජලය සපයනු ලබන ඇළ පද්දතිය වැඩි දියුණු කිරීම. | | රු.මි. 156.37 |
| | • පුල්මුඩේ අමුණ සහ ඒ යටතේ ජලය සපයන ඇළ පද්ධතිය වැඩිදියුණු කිරීම. | | රු.මි. 97.53 |
| | • අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම. | | රු.මි. 218.81 |
| | • වාහල්කඩ කපුගොල්ලැව මාර්ගය ඉදි කිරීම. | | රු.මි. 216.05 |
| | • යටිතල පහසුකම් සහ නැවත පදිංචි කිරීම. | | රු.මි. 21.05 |
| | • අනෙකුත් වියදම් | | රු.මි. 94.21 |
| 2026 වසර සඳහා යෝජිත වැඩසටහන | • ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීම<br>• ප්‍රවේශ මාර්ග සහ පාලම් ඉදි කිරීම<br>• නව වාරි ඉඩම් සංවර්ධනය කිරීම (ඉස්සන්වැව ඇතුළුව)<br>• ජයන්තිවැව පහළ නිම්න සංවර්ධනය<br>• ත්‍රිකුණාමලයේ පවතින වාරි පද්ධති 07 ක් වැඩිදියුණු කිරීම<br>• පුල්මුඩේ අමුණ පද්ධතිය වැඩිදියුණු කිරීම<br>• නැවත පදිංචි කිරීමේ ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය | | |

| | |
|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • නව වගා බිම් හෙක්ටයාර 1,515ක් ඇතුළුව සම්පූර්ණ හෙක්ටයාර 8,700ක් සඳහා වාරි පහසුකම් සැපයීම<br>• අනුරාධපුර සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක දෙකෙහිම ජනතාව සඳහා පානීය ජලය සැපයීම.<br>• මාර්ග සංවර්ධනය: කිලෝමීටර් 8ක කාපට් මාර්ග, කිලෝමීටර 40ක බොරළු මාර්ග සංවර්ධනය<br>• ජලය, විදුලිය, පාසල්, පොදු ගොඩනැගිලි ආදිය සැපයීම ඇතුළුව මල්පෝරුව, කපුවත්ත, උරුව ඕමාරකඩ සහ D6 වාහල්කඩ නැවත පදිංචි කිරීමේ ගම්මාන සංවර්ධනය කිරීම.<br>• කිලෝමීටර් 16ක් දිගින් යුත් අලි වැටවල් ඉදි කිරීම.<br>• ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදවිය මහා වාරි යෝජනා ක්‍රමය, යාන්ඔය අමුණ යෝජනා ක්‍රමය සහ කුඩා/මධ්‍යම පරිමාණ වැව්වල ජල හිඟය විසඳීම.<br>• මිරිදිය ධීවර හා පශු සම්පත් කර්මාන්තය සඳහා පහසුකම් සැලසීම.<br>• වාහල්කඩ සහ ත්‍රිකුණාමලය අතර ප්‍රවාහන දුර කිලෝමීටර 60කින් පමණ අවම කිරීම. |
| **සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ** | • නව වගා බිම් ඇතුළුව සම්පූර්ණ හෙක්ටයාර 18,516 ක් සඳහා වාරි පහසුකම් සැපයීම<br>• මාර්ග සංවර්ධනය : කි.මී 8 කාපට් මාර්ගය සහ කිලෝමීටර 40 බොරළු මාර්ග<br>• ජලය, විදුලිය, පාසල්, පොදු ගොඩනැගිලි ආදිය සැපයීම ඇතුළුව මල්පෝරුව, කපුවත්ත, උරුව ඕමාරකඩ සහ D6 වාහල්කඩ නැවත පදිංචි කිරීමේ ගම්මාන සංවර්ධනය කිරීම<br>• වාහල්කඩ සහ ත්‍රිකුණාමලය අතර ප්‍රවාහන දුර අවම කිරීම<br>• වාහල්කඩ සිට ත්‍රිකුණාමලය සහ හොරොව්පතාන අතර ප්‍රවාහන දුර අවම කිරීම. |
| **අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු** | • ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය<br>• 2021 දී කොවිඩ් වසංගතය, 2022 දී ආර්ථික අර්බුදය හේතුවෙන් ඉන්ධන සහ ඉදිකිරීම් ද්‍රව්‍ය වල සැපයුම සීමා වීම සහ ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල අනපේක්ෂිත ලෙස ඉහළ යාම.<br>• RAMP කමිටු තීරණය හේතුවෙන් ඉදිකිරීම් සීමා කිරීම.<br>• තක්සේරු කිරීම ප්‍රමාද වීම හේතුවෙන් වන්දි ගෙවීම ප්‍රමාද විය.<br>• සංවර්ධනය සඳහා ඉඩම් නිදහස් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් වාරිමාර්ග ඉඩම් සංවර්ධන කටයුතු ප්‍රමාද විය.<br>• 2025 දී අයහපත් කාලගුණික තත්ත්වයන් සහ දරුණු ගංවතුර<br>• තාක්ෂණික කාර්ය මණ්ඩල හිඟය |
| **අභියෝග** | • සැලසුම් කළ පරිදි අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් ඉඩම් නොමැති වීම.<br>• ඉඩම් අත්පත් කිරීමේ සහ විකල්ප ඉඩම් ලබාදීමේදී ආයතන ගණනාවක් සමග සම්බන්ධීකරණ කල යුතු වීම<br>• අනපේක්ෂිත කාලගුණික තත්ත්වයන් වලට මුහුණ දීමට සිදු වීම .<br>• අවතැන් වූ ප්‍රජාවගේ දුක්ගැනවිලි සහ ඉල්ලීම<br>• තාක්ෂණික කාර්ය මණ්ඩල හිඟය (ඉංජිනේරුවන්, ඉංජිනේරු සහකාර, සැලසුම්ශිල්පී) |

## 2. ඇල්ලේවැව ජලාශය

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තු ගත මුදල** | රු.මි. 2,950.00 | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | රත්නපුර |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය** | ඝන මීටර මිලියන 1.91 පවතින ඉඩම් හෙක්ටයාර 456 ක් සහ නව ඉඩම් හෙක්ටයාර 141.6 ක් |
| **ව්‍යාපෘති කාලය** | 2021-2026 | **ප්‍රතිලාභීන්** | පවුල් 4,000 |
| **කල් දිගු ලබාදීම්** | 2024 – 2026 | **කල් දිගු ලබා දීමට හේතු** | නියමිත පරිදි ව්‍යාපෘතිය අවසන් වී නොතිබීම |
| **ප්‍රතිපාදන 2025** | රු.මි. 910 | **2026 වසර සඳහා ප්‍රතිපාදන** | රු.මි. 326.31 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 801.31 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 51.10 |
| **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 326.31 | | |
| **2025 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම** | • ප්‍රධාන බැම්මේ ඉදිකිරීම් 46.06%ක් අවසන් කර ඇත.<br>• සොරොව්වේ වැඩ කටයුතු 74.90% කින් අවසන් කිරීම.<br>• 2 වන බැම්මේ ඉදිකිරීම් 76.14%ක් අවසන් කර ඇත.<br>• ප්‍රාරම්භක වැඩ | | රු.මි. 235.23<br>රු.මි. 7.81<br>රු.මි. 25.65<br>රු.මි. 4.62 |
| **2026 වසර සඳහා යෝජිත වැඩසටහන** | • ප්‍රධාන වේල්ල ඉදිකිරීම 90% ක් දක්වා අවසන් කිරීම.<br>• සොරොව්ව සහ පහළ පිටවාන ඉදිකිරීම 95% ක් දක්වා අවසන් කිරීම.<br>• වේල්ල අංක 02 ඉදිකිරීම 100% ක් දක්වා අවසන් කිරීම.<br>• වේල්ල අංක 03 ඉදිකිරීම 100% ක් දක්වා අවසන් කිරීම.<br>• වාන් නිර්මිතය ඉදිකිරීම 96% ක් දක්වා අවසන් කිරීම.<br>• නැවත පදිංචි කිරීම, වන්දි ගෙවීම සහ යටිතල පහසුකම් සැපයීම.<br>• පහළ නිම්න සංවර්ධන කටයුතු සිදුකිරීම | | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • කෘෂිකාර්මික හා ගෘහාශ්‍රිත කටයුතු සඳහා ජලය සැපයීමෙන් ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.<br>• වියළි කාලවලදී වාරි කෘෂිකර්මාන්තය සඳහා ජල සුරක්ෂිතතාව සහතික කිරීම.<br>• දැනට පවතින හුලංදාව සහ පනාමුර යෝජනා ක්‍රමයේ භෝග තීව්‍රතාවය වැඩි කිරීම සහ ජලය සැපයිය හැකි ප්‍රදේශය හෙක්ටයාර 141.6කින් පුළුල් කිරීම.<br>• කොලොන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා පානීය ජල ඉල්ලුම දිනකට ඝන මීටර 7,000ක් සැපයීම.<br>• මිරිදිය ධීවර කර්මාන්තයට සහ පාරිසරික අවශ්‍යතාවලට දායකත්වය සැපයීම. | | |
| **සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ** | කොළොන්න ජල යෝජනා ක්‍රමය යටතේ පානීය ජල සම්බන්ධතාව දීර්ඝ කරමින් පවතී<br>(ව්‍යාපෘතිය අවසන් වූ පසු කෘෂිකාර්මික ප්‍රතිලාභ ලගා කර ගත හැක.) | | |

| | |
|---|---|
| **අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු** | • 2021 දී කෝවිඩ් වසංගතය හේතුවෙන් වැඩබිම වසා තැබීම<br>• 2022 දී ආර්ථික අර්බුදය හේතුවෙන් ඉන්ධන සහ ඉදිකිරීම් ද්‍රව්‍ය සීමා වීම සහ ද්‍රව්‍ය මිල විශාල ලෙස ඉහළ යාම<br>• 2022/2023 දී ව්‍යාපෘති අත්හිටුවීම සඳහා RAMP කමිටුවෙන් ලබා දී තිබූ තීරණය<br>• 2024 වසරේදී ප්‍රධාන වේල්ල සඳහා පස් සපයා ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදය<br>• 2025 පැවති අයහපත් කාලගුණික තත්ත්වය |
| **අභියෝග** | • ප්‍රධාන වේල්ලේ පාදම සඳහා අවශ්‍ය මැටි සහ වේල්ලේ ඉදිකිරීම් සඳහා සුදුසු වන පස් ප්‍රදේශයේ නොමැතිකම.<br>• ප්‍රාදේශීය මාර්ග ඔස්සේ ද්‍රව්‍ය ප්‍රවාහන ගැටලුව. |

### 3. මුන්දෙනි ආරු ගංඟාද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය (රුගම් කිතුල්)

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තු ගත මුදල | රු.මි. 24,141 | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | අම්පාර සහ මඩකලපුව |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය + විදේශීය ණය | **ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය** | රුගම් කිතුල් - ඝන මීටර මිලියන 58<br>මහ ඔය - ඝන මීටර මිලියන 80<br>හෙක්ටයාර 6,500 |
| ව්‍යාපෘති කාලය | අවුරුදු 06<br>2021 – 2028 | **ප්‍රතිලාභීන්** | පවුල් 50,000 |
| **ප්‍රතිපාදන 2025** | රු.මි. 100 | **2026 වසර සඳහා ප්‍රතිපාදන** | රු.මි. 50 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 386.65 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 2.39 |
| **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 2.5 | | |
| **2025 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම** | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අධීක්ෂණය සහ ඇගයීම | | රු.මි. 2.50 |
| **2026 වසර සඳහා යෝජිත වැඩසටහන** | • ව්‍යාපෘති කළමනාකරණ ඒකක අධීක්ෂණය සහ ඇගයීම<br>• ඉංජිනේරු සැලසුම් සහ වැඩ අධීක්ෂණය සඳහා ජාත්‍යන්තර උපදේශන සේවාව | | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • පවුල් 10,000කට අයත් වගා කළ හැකි සහ වගා කටයුතු සිදු කරන ඉඩම් හෙක්ටයාර 10,500කට පමණ වාරි පහසුකම් සපයා දීම.<br>• මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කයේ පවුල් 31,000කට පානීය ජලය සැපයීම.<br>• පහළ නිම්නයේ ගංවතුර පාලනය කිරීම.<br>• ජලාශ දෙකෙහිම මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වසරකට මෙට්‍රික් ටොන් 800කින් වැඩි කිරීම. | | |

| | |
|---|---|
| | • කිලෝමීටර් 85ක මාර්ග ජාලයක් ඉදිකිරීම.<br>• නගර සංවර්ධනය කිරීම.<br>• අලි වැට ඉදිකිරීම.<br>• නැවත වන වගා වැඩසටහන.<br>• ආදායම් උත්පාදනය කිරීමේ වැඩසටහන් සහ පුහුණුව (කෘෂිකාර්මික හා පශු සම්පත් ව්‍යාප්තිය). |
| **සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ** | මේ වන තුරු ප්‍රතිලාභ ලැබී නොමැත |
| **අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු** | අරමුදල් සපයන ආයතනය සමඟ තවමත් ණය ගිවිසුමක් අත්සන් කර නොමැත. |
| **අභියෝග** | ණය ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් AFD අරමුදල් ප්‍රමාද වීම හා ණය ගිවිසුම අත්සන් කර නොමැති වීම<br>ඉඩම් අත්පත් කර ගැනීමේ පටිපාටියේ දුෂ්කරතා. |

**4. ගොඩිගමුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම.**

| ඇස්තමේන්තු ගත මුදල | රු.මි. 357 | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | මාතලේ |
|---|---|---|---|
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය** | ඝන මීටර මිලියන 0.25<br>හෙක්ටයාර 119 |
| **ව්‍යාපෘති කාලය** | 2018-2026 | **ප්‍රතිලාභීන්** | පවුල් 265 පමණ |
| **කල් දිගු ලබාදීම්** | 2021 - 2023<br>2023 - 2024<br>2024 - 2025<br>2025 - 2026 | **කල් දිගු ලබා දීමට හේතු** | • භූගෝලීය සහ සමාජ අවශ්‍යතා අනුව ව්‍යාපෘති යෝජනාවේ සිදුකළ වෙනස්කම්<br>• නියමිත වේලාවට අරමුදල් නොලැබීම<br>• Covid 19 වසංගතය<br>• ආර්ථික අර්බුදය සහ ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟතාවය |
| **ප්‍රතිපාදන 2025** | රු.මි. 90 | **2026 වසර සඳහා ප්‍රතිපාදන** | රු.මි. 50 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 269.72 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 74.84 |
| 2025 **වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 44.35 | | |

| | | |
|---|---|---|
| **2025 වසර තුළ ක්‍රියාත්මක කළ** වැඩසටහන / දරන ලද වියදම (රු.මි) | කාර්යාලය හා ගබඩාව ඇතුළු මූලික වැඩ<br>වැව් බැම්ම ඉදිකිරීම<br>රළපනාව (Rip rap) හා දියපෙරනය (Toe Filter) ඉදිකිරීම<br>පිටවාන ඉදිකිරීම | රු.මි . 0.248<br>රු.මි. 0.167<br>රු.මි. 6.004<br><br>රු.මි. 3.214 |

| | | |
|---|---|---|
| | අමුණ ඉදිකිරීම<br>පෝෂක ඇල ඉදිකිරීම<br>ප්‍රධාන ඇල ඉදිකිරීම හා IFF වැඩ | රු.මි. 3.268<br>රු.මි. 2.222<br>රු.මි. 29.224 |
| **2026 වසර සඳහා යෝජිත වැඩසටහන** | • පිටවාන ඉදිකිරීම (ඉතිරි වැඩ)<br>• ප්‍රධාන ඇල ඉදිකිරීම සහ ක්ෂේත්‍රයේ ඉතිරි සංවර්ධන වැඩ කටයුතු<br>• පෝෂක ඇල ඉදිකිරීම (ඉතිරි වැඩ) | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • නව කුඹුරු ඉඩම් හෙක්ටයාර 119 සඳහා වාරි පහසුකම් සැපයීම<br>• ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවන අතර ජාතියේ ආහාර නිෂ්පාදනයට දායක වීම | |
| **සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ** | • අක්කර 35 ක මහ කන්නයේ වගා කර ඇත.<br>• අක්කර 10 ක් යල කන්නයේ අතුරු බෝග වගා කර ඇත. | |
| **අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු** | ජුලි මාසෙන් පසුව ප්‍රතිපාදන ලැබීම සහ සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසයන්හිදී වර්ෂාපතනය කලින් ලැබීම නිසා සැලසුම් කල පරිදි ඉදිකිරීම් කටයුතු කරගෙන යා නොහැකි වීම. | |
| **අභියෝග** | • කුඩා වර්ෂාපතනයකදී පවා වැඩ කළ නොහැකි භූමියක් ලෙස වැඩබිම පත් වීම.<br>• අනපේක්ෂිත වර්ෂාපතනය<br>• කල් දිගුව සඳහා අනුමැතිය ලබා ගැනීමට දීර්ඝ කාලයක් ගතවීම. | |

### 5. උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල** | රු.මි. 22,017.00 | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | මොණරාගල, හම්බන්තොට |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය** | අලිකොට ආර - ඝන මීටර මිලියන 6.5<br>කුඩා ඔය - ඝන මීටර මිලියන 22.6<br>හඳපානාගල - ඝන මීටර මිලියන 14<br>නව ඉඩම් හෙක්ටයාර 4500 සහ පවතින ඉඩම් හෙක්ටයාර් 1500 |
| **ව්‍යාපෘති කාලය** | 2013 -2026 | **ප්‍රතිලාභීන්** | පවුල් 5,700 |
| **කල් දිගු ලබාදීම්** | 2022/12/31<br>2024/12/31<br>2026/12/31 | **කල් දිගු ලබා දීමට හේතු** | නියමිත පරිදි ව්‍යාපෘතිය අවසන් වී නොතිබීම |
| **ප්‍රතිපාදන 2025** | රු.මි.2,150 | **2026 වසර සඳහා ප්‍රතිපාදන** | රු.මි.2,175 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 18,678.64 | **සමස්ත භෞතික ප්‍රගතිය (%)** | 88.53 |
| **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 989.64 | | |

| | | |
|---|---|---|
| **2025 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම** | • කුඩාඔය ජලාශය ඉදිකිරීම – 99.8% | රු.මි. 96.50 |
| | • අලිකොට ආර - කුඩාඔය ඇළ ඉදිකිරීම – 85% | රු.මි.708.65 |
| | • කුඩාඔය - සිංහලයාගම ඇළ ඉදිකිරීම – 79% | රු.මි.177.01 |
| | • ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සහ නැවත වන වගාව | රු.මි. 1.54 |
| **2026 වසර සඳහා යෝජිත වැඩසටහන** | • කුඩාඔය ජලාශය ඉදිකිරීම අවසන් කිරීම<br>• අලිකොටආර සිට කුඩාඔය හරස් ඇල ඉදිකිරීම අවසන් කිරීම<br>• කුඩාඔය සිට සිංහලයාගම හරස් ඇල ඉදිකිරීම අවසන් කිරීම<br>• ග්‍රාමීය වාරි පද්ධති සංවර්ධනය (සුළු වැව් 59)<br>• වැල්ලවාය සහ තණමල්විල ප්‍රදේශවල නව පෝෂිත ඇල පද්ධතියක් ඉදිකිරීම. | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • උමා ඔය ද්‍රෝණියේ සිට කිරිඳි ඔය ද්‍රෝණියට වාර්ෂිකව ඝන මීටර මිලියන 145 ජලය සැපයීම.<br>• නව ඉඩම් හෙක්ටයාර 4500 කට සහ දැනට පවතින ඉඩම් හෙක්ටයාර 1500 කට ජලය සැපයීම.<br>• මොනරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා ඝන මීටර මිලියන 30 පානීය හා කාර්මික ජලය සැපයීම.<br>• සත්ත්ව ගොවිපොළ සහ මිරිදිය ධීවර සංවර්ධනය<br>• නවීන තාක්ෂණයේ දැනුම හුවමාරු කිරීම<br>• කුඩා වැව් 54ක් වැඩි දියුණු කිරීම සහ වැව් 110කට ජලය සැපයීම | |
| **සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ** | • හඳපානාගල වම් සහ දකුණු ඉවුරු ඇල මගින් යල සහ මහ කන්න සඳහා හෙක්ටයාර 1141ක් සඳහා වාරි ජලය සැපයීම<br>• අලිකොට ආර හැරවුම් ඇල මාර්ගය යටතේ යල සහ මහ කන්න සඳහා හෙක්ටයාර 969 ක් සඳහා වාරි ජලය සැපයීම<br>• කුඩා ඔය - සිංහලයාගම හැරවුම් ඇල මාර්ගය යටතේ යල කන්නය සඳහා හෙක්ටයාර 2681 ක් සහ මහ කන්නය සඳහා හෙක්ටයාර 3524ක් සඳහා වාරි ජලය සැපයීම<br>• හඳපානාගලා සහ අලිකොට ආර ජලාශ වල ධීවර සමිති පිහිටවා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සිදුකරමින් පවතී<br>• කුඩා වැව් 54ක් වැඩි දියුණු කිරීම සහ වැව් 110කට ජලය සැපයීම<br>• ව්‍යාපෘතිය ඍජු ශ්‍රමය යටතේ සිදුකල බැවින් හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්ක වල පුහුණු ශ්‍රමිකයන් විශාල ප්‍රමාණයක් බිහි වීම | |
| **අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු** | • COVID 19 වසංගතය, ආර්ථික අර්බුදය නිසා ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම සහ අපේක්ෂිත ප්‍රතිලාභ ලගා කර ගැනීමට ප්‍රමාද වීම<br>• RAMP කමිටු තීරණ අනුව ඉදිකිරීම් සීමා කිරීමට සිදු වීම.<br>• ආර්ථික අර්බුදය නිසා ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟ වීම සහ ඉන්ධන මිල ඉහල යාම<br>• කාලය දීර්ඝ කිරීම සහ සංශෝධිත ඇස්තමේන්තුව සඳහා වූ කැබිනට් පත්‍රිකාව 2025.06.03 දින අනුමත කරන ලදී | |
| **අභියෝග** | • තාක්ෂණික කාර්ය මණ්ඩල හිඟය<br>• ප්‍රසම්පාදන සීමාවන් සීමා කිරීම<br>• ඉදිකිරීම් දුෂ්කරතා<br>• අයහපත් කාලගුණික තත්ත්වය | |

## 6. පහළ මල්වතු ඔය බහු කාර්යය සංවර්ධන ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තු මුදල | රු.මි. 47,180.00 | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | අනුරාධපුර, මන්නාරම සහ වවුනියාව |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය** | ඝන මීටර මිලියන 209<br>හෙක්ටාර 13,472 |
| ව්‍යාපෘති කාලය | 2016 - 2030 | **ප්‍රතිලාභීන්** | අනුරාධපුර, මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්කවල ජීවත් වන ජනතාව |
| **කල් දිගු ලබාදීම්** | 2024 -2030 | **කල් දිගු ලබා දීමට හේතු** | • **NOR** තීරණය අනුව 2023 දී **PMU** වසා දැමීම.<br>• **RAMP** කමිටු තීරණය අනුව ව්‍යාපෘතිය තාවකාලිකව නතර කිරීම.<br>• ආර්ථික අර්බුදය හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍ය හා ඉන්ධන සපයා ගැනීම අපහසු වීම. |
| **ප්‍රතිපාදන 2025** | රු.මි. 2,655 | **2026 වසර සඳහා ප්‍රතිපාදන** | රු.මි. 5,000 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 2205.05 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 11.21 |
| **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 387.61 | | |
| **2025 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම** | • පස් බැම්ම ඉදිකිරීම සහ අමතර වැඩ | | රු.මි. 63.51 |
| | • දකුණු ඉවුරේ සොරොව්ව ඉදිකිරීම | | රු.මි . 7.90 |
| | • නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය | | රු.මි. 91.81 |
| | • ඇල මාර්ග පද්ධතිය | | රු.මි. 0.62 |
| | • පාරිසරික කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම | | රු.මි. 96.98 |
| | • විපතට පත් ජනතාව සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ප්‍රධාන කටයුතු | | රු.මි. 0.96 |
| | • වාන් මාර්ගයේ වම් පස ඇති පාෂාණමය කොටස් පුපුරවා ඉවත් කිරීම | | රු.මි. 55.35 |
| **2026 වසර සඳහා යෝජිත වැඩසටහන** | • ජලාශ බැම්ම ඉදිකිරීම සහ ඉතිරි වැඩ<br>• අරීය ගේට්ටු සහිත පිටවාන ඉදිකිරීම හා වාන් මාර්ගයේ වම් පස ඇති පාෂාණමය කොටස් ඉවත් කිරීම<br>• දකුණු ඉවුරෙහි සොරොව්ව ඉදිකිරීම<br>• නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය<br>• පාරිසරික කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම<br>• ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීමේ කටයුතු. | | |

| | |
|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • නව වාරි ප්‍රදේශ හෙක්ටයාර 810 ක් (වී සහ අතුරු බෝග ) සඳහා වාරි පහසුකම් සැපයීම.<br>• පවතින වාරි ප්‍රදේශ හෙක්ටයාර 12,416 ක් (යෝධ වැව සහ අකතිමුරිප්පු වැව) සඳහා වාරි පහසුකම් සැපයීම.<br>• වවුනියාව, මන්නාරම සහ අනුරාධපුර දිස්ත්‍රික්ක වල වාර්ෂික ගෘහස්ථ ජල ඉල්ලුම සපුරාලීම සඳහා ජලය 21 MCM සැපයීම.<br>• වාර්ෂිකව ව්‍යාපෘතිය හරහා ජනනය කෙරෙන 4.68 GWh ක විදුලිය ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීම.<br>• නව නගර සැලසුම් ව්‍යාපෘතිය යටතේ තන්තිරිමලේ නගරය සංවර්ධනය කිරීම.<br>• වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්කවල ගංවතුර අවම කිරීම.<br>• සූර්ය බලශක්ති ව්‍යාපෘති හඳුන්වා දීම<br>• ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය.<br>• අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම<br>• විල්පත්තු ජාතික වන රක්ෂිතයේ නැවත වන වගාව සහ සංරක්ෂණය. |
| **සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ** | • ශ්‍රම තීව්‍ර සහ යන්ත්‍රෝපකරණ පාදක භූමිකාවන් ඇතුළුව ව්‍යාපෘතිය තුළ දේශීය සේවකයින් සඳහා නව රැකියා අවස්ථා ලැබීම.<br>• වේලි ඉදිකිරීම් කටයුතු සම්බන්ධව කම්කරුවන්ගේ සහ කාර්ය මණ්ඩලයේ අත්දැකීම් වැඩි දියුණුවීම. |
| **අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු** | • 2021 දී කොවිඩ් වසංගතය, 2022 දී ආර්ථික අර්බුදය හේතුවෙන් ඉන්ධන සහ ද්‍රව්‍ය සීමා කිරීම සහ ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල අනපේක්ෂිත ලෙස ඉහළ යාම<br>• 2022/2023 දී ව්‍යාපෘති අත්හිටුවීම සඳහා RAMP තීරණය<br>• ප්‍රධාන රජයේ දෙපාර්තමේන්තු වලින් (උදා: පතල් බලපත්‍ර සඳහා GSMB, වන හා වනජීවී බලධාරීන්) අනුමැතිය ලබා ගැනීමේදී අනවශ්‍ය ප්‍රමාදයන්.<br>• 2023/2022 සඳහා RAMP/NOR නිර්දේශවල සඳහන් කර ඇති පරිදි, හොඳින් අර්ථ දක්වා ඇති ඉලක්ක නොමැතිකම<br>• වාන් නිර්මිතය ඉදිකිරීම වැනි ව්‍යාපෘති විෂය පථයේ නිතර සිදුවන වෙනස්කම් |
| **අභියෝග** | • ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) අවලංගු කිරීම හේතුවෙන් මූල්‍ය, ප්‍රසම්පාදන සහ කාර්ය මණ්ඩල සීමාවන්ට බාධාවන් සිදුවීම.<br>• බඳවා ගැනීම් සීමා කිරීම හේතුවෙන් පුහුණු කාර්ය මණ්ඩලය සීමිත වීම. |

## 7. ඒරු වැව - මහකනදරාව පෝෂිත ඇල ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තු මුදල | රු.මි. 2,000 | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | අනුරාධපුරය |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය** | • මහකනදරාව (වාන එසවීමෙන් පසු) - ඝ.මී.මි 47.39, හෙක්ටයාර 1658<br>• ඒරු වැව (වාන එසවීමෙන් පසු) - ඝ.මී.මි 7.57, හෙක්ටයාර 85 |
| **ව්‍යාපෘති කාලය** | 2024-2026 | **ප්‍රතිලාභීන්** | ගොවි පවුල් 5237 සහ පවුල් 20,000ක් සඳහා පානීය ජල පහසුකම් සැපයීම. |
| **ප්‍රතිපාදන 2025** | රු.මි. 500 | **2026 වසර සඳහා ප්‍රතිපාදන** | රු.මි. 500 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 776.12 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 89.17 |
| **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | 400.33 | | |
| **2025 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම** | • ඒරුවැව වැව 98% වැඩිදියුණු කිරීම<br>• ඒරුවැව සිට මුද්දිරිප්පුව වැව දක්වා පෝෂිත ඇල 94%වැඩිදියුණු කිරීම<br>• මුද්දිරිප්පුව වැවේ සිට මහනොච්චිකුලම දක්වා පෝෂිත ඇල 98%වැඩිදියුණු කිරීම<br>• මහනොච්චිකුලම වැවේ සිට කනදරා ඔය දක්වා පෝෂක ඇල 98%වැඩිදියුණු කිරීම<br>• මුද්දිරිප්පුව සහ මහනොච්චිකුලම වැව් 91% වැඩිදියුණු කිරීම<br>• මහකනදරාව මූලස්ථායී වැඩ වැඩිදියුණු කිරීම. 91.2% | | රු.මි. 26.15<br>රු.මි. 130.45<br>රු.මි. 15.91<br>රු.මි. 8.77<br>රු.මි. 37.49<br>රු.මි. 136.05 |
| **2026 වසර සඳහා යෝජිත වැඩසටහන** | • මැනුම්, විමර්ශන සහ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම<br>• ඒරුවැව සිට මුද්දිරිප්පුව වැව දක්වා පෝෂිත ඇල වැඩිදියුණු කිරීම අවසන් කිරීම<br>• මුද්දිරිප්පුව වැවේ සිට මහනොච්චිකුලම දක්වා පෝෂිත ඇල වැඩිදියුණු කිරීම අවසන් කිරීම<br>• මහනොච්චිකුලම වැවේ සිට කනදරා ඔය දක්වා පෝෂක ඇල වැඩිදියුණු කිරීම<br>• මුද්දිරිප්පුව සහ මහනොච්චිකුලම වැව් ඉතිරි වැඩ කොටස් අවසන් කිරීම<br>• මහනොච්චිකුලම සිට කනදරා ඔය දක්වා පෝෂිත ඇල වැඩිදියුණු කිරීම<br>• මහකනදරාව මූලස්ථායී වැඩ සිදුකිරීම | | |

| | |
|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • මහකනදරාවේ වගා තීව්‍රතාවය 1.6 සිට 2 දක්වා වැඩි කිරීම.<br>• පානීය ජල පහසුකම් සඳහා ජලය සැපයීම.<br>• ඒරුවැව සහ මහකනදරාව ධීවර කර්මාන්තය ඉහල නැංවීම. |
| **සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ** | • වගා තීව්‍රතාවය 1.6 - 1.8 පමණ දක්වා වැඩි වීම.<br>• NWSDB සඳහා ජලය සැපයීම - 80% අවසන් |
| **අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු** | • වෙනත් ආයතනවලින් (පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව) අවසර ලබා ගැනීම හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද වීම.<br>• අනපේක්ෂිත කාලගුණික තත්වයන් හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම සහ වගා තීව්‍රතාවය වැඩි කිරීම සඳහා බාධා පැමිණීම. |
| **අභියෝග** | • පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වැනි වෙනත් ආයතනවලින් නිෂ්කාශන ලබාගැනීමේ දුෂ්කරතා<br>• වන සතුන්ගෙන් සිදුවන බලපෑම් |

## 8. ගල්ඔය, රාජාංගනය, හුරුළුවැව සහ මින්නේරිය වාරි යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය.

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තු මුදල | රු.මි. 2,000 | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | අම්පාර, අනුරාධපුර, පොළොන්නරුව |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය** | හෙක්ටයාර 69,350.98 |
| **ව්‍යාපෘති කාලය** | **2025** | **ප්‍රතිලාභීන්** | පවුල් 100,000 |
| **ප්‍රතිපාදන 2025** | රු.මි. 2,000 | **2026 වසර සඳහා ප්‍රතිපාදන** | - |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 1514.15 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 96 |
| **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 1514.15 | | |
| **2025 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම** | • ගල්ඔය ව්‍යාපාරයෙහි ගංවතුර හානිය ප්‍රතිසංස්කරණ<br>• රාජාංගනය ව්‍යාපාරයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු<br>• හුරුළුවැව ව්‍යාපාරයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු<br>• මින්නේරිය සහ ගිරිතලේ ව්‍යාපාරයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු | | රු.මි. 644.89<br>රු.මි. 194.59<br>රු.මි. 224.93<br>රු.මි. 449.63 |
| **2026 වසර සඳහා යෝජිත වැඩසටහන** | • ප්‍රතිසංස්කරණ වැඩවල ඉතිරි වැඩ - 4%<br>• පියවීමට ඇති අතැති බිල්පත් පියවීම | | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | වාරි යෝජනා ක්‍රම තුල ප්‍රශස්ත මට්ටමේ කාර්යක්ෂම ජලය බෙදා හැරීමක් සිදුකර ගැනීම.මෙමගින් බෝග තීව්‍රතාවය වැඩි කිරීම මෙන්ම වක්‍ර ප්‍රතිලාභ ලබන වන ජීවී පද්ධති හා ග්‍රාමීය ජන ජීවිතය නගා සිටුවීම. | | |
| **සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ** | 2024 වර්ෂයේ ගංවතුර නිසා හානියට පත් වූ කුඹුරු ඉඩම් යල හා මහ කන්නය සඳහා වගා කිරීම. | | |

| | |
|---|---|
| **අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු** | • වගා නොකරන කාලයේ පමණක් ඉදිකිරීම් කටයුතු කිරීමට සැලසුම් කර තිබීම.<br>• දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ගල්ඔය සහ රාජාංගනය ව්‍යාපාර යටතේ ඉදිකිරීම් කටයුතු අපේක්ෂා කළ පරිදි නිම කිරීමට නොහැකි විය.<br>• 2025 අයවැය අනුමැතියෙන් පසු ඇස්තමේන්තු පිළියෙල කිරීම ආරම්භ කිරීම.<br>• දිට්වා සුළි කුණාටුව වැනි අයහපත් කාලගුණික තත්ත්වයන් පැවතීම.<br>• 2025 වර්ෂය තුල ඉදිකිරීම් කටයුතු නිම කළ යුතු අතර බොහෝ ඉදිකිරීම් කටයුතු වගා නොකරන කාලය තුල සිදුකිරීමට වීම.<br>• සමහර කොන්ත්‍රාත්කරුවන් නියමිත කාලයේ ඉදිකිරීම් ආරම්භ කර නොතිබූ අතර කොන්ත්‍රාත් ගිවිසුම අනුව එම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට සිදුවීම. |
| **අභියෝග** | **-** |

## 9. තෝරාගත් මහා වාරිමාර්ග ව්‍යාපෘති වල අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු (ERIMIS)

| | | | | |
|---|---|---|---|---|
| ඇස්තමේන්තුගත මුදල | | ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක | සියලුම කලාප | |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය** | **-** | |
| **ප්‍රතිපාදන 2025** | රු.මි. 3,933.02 | **2026 වසර සඳහා ප්‍රතිපාදන** | රු.මි. 6,500.00 | |
| **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 3,812.16 | **2025 වර්ෂයේ භෞතික ප්‍රගතිය (%)** | 96.93 | |
| **කලාප අනුව ප්‍රගතිය** | **කලාපය** | **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | **සමස්ත භෞතික ප්‍රගතිය (%)** | **2026 වසර සඳහා ප්‍රතිපාදන (රු.මි.)** |
| | අම්පාර | 200.47 | 65.0 | 300.0 |
| | අනුරාධපුරය | 592.82 | 91.0 | 800.0 |
| | බදුල්ල | 318.09 | 68.0 | 700.0 |
| | මඩකලපුව | 400.35 | 98.0 | 250.0 |
| | කොළඹ | 73.41 | 66.0 | 200.0 |
| | ගාල්ල | 133.55 | 84.0 | 200.0 |
| | හම්බන්තොට | 577.40 | 99.0 | 250.0 |
| | මහනුවර | 163.56 | 93.0 | 600.0 |
| | කුරුණෑගල | 185.80 | 53.0 | 600.0 |
| | මන්නාරම | 187.46 | 74.0 | 250.0 |
| | මොණරාගල | 182.35 | 83.0 | 250.0 |
| | පොළොන්නරුව | 250.71 | 89.0 | 300.0 |
| | පුත්තලම | 135.52 | 58.0 | 300.0 |
| | ත්‍රිකුණාමලය | 410.46 | 99.0 | 600.0 |
| **2025 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම** | ඉදිකිරීම් වැඩ 1,073 ක් සඳහා ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදී | | | |
| **2026 වසර සඳහා යෝජිත වැඩසටහන** | ප්‍රධාන යෝජනා ක්‍රම වලට අදාල ඇළ මාර්ග සහ ව්‍යුහයන් ප්‍රතිසංස්කරණය කිරීම | | | |

| | |
|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • ඇල මාර්ග වල ජල හානිය අවම කිරීම<br>• ජල පාලනය විධිමත් කිරීම<br>• අවශ්‍ය ජල ප්‍රමාණයන් නියමිත පරිදි වගා ඉඩම් සඳහා ලබා දීම<br>• ඇල මාර්ග වල ස්ථායිතාවය වැඩි කිරීම |
| **සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ** | • තෝරාගත් ඇළ මාර්ග වැඩිදියුණු කිරීම<br>• තෝරාගත් ප්‍රධාන වැඩ සහ වැව් වැඩිදියුණු කිරීම |
| **අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු** | අධික වර්ෂාපතනය, ගංවතුර තත්ත්වය හා අක් මුදල් ප්‍රමාදයන් |

**වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වෙන වෙනත් ව්‍යාපෘති**

## 1. බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තු මුදල** | මුල් ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 2,347+ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද මිල විචලනය IPC 21 දක්වා රුපියල් මිලියන 1,085 | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | ගම්පහ |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය ( චීන EXIM බැංකුවෙන් ණය ආධාර යටතේ) | **ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය** | ඝන මීටර මිලියන 5.5 |
| **ව්‍යාපෘති කාලය** | 2019-2025 | **ප්‍රතිලාභීන්** | පවුල් 250,000 |
| **ප්‍රතිපාදන 2025** | සිදු කරන ලද කාර්යය මත පදනම්ව ගෙවීම | **2026 වසර සඳහා ප්‍රතිපාදන** | සිදු කරන ලද කාර්යය මත පදනම්ව ගෙවීම |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 3185.00 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 100 |
| **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 458 | | |
| **2025 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම** | • ඉඩම් අත්පත් කිරීම සම්බන්ධ ඉතිරි කටයුතු<br>• වැව් බැම්ම සහ අනෙකුත් ව්‍යුහයන්ගේ ඉදිකිරීම<br>• මාර්ග හා පාලම් ඉදිකිරීම් | | |
| **2026 වසර සඳහා යෝජිත වැඩසටහන** | ව්‍යාපෘතිය අවසන් කර ඇත | | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | ගම්පහ, අත්තනගල්ල මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය (GAMIWSS) යටතේ ගම්පහ දිස්ත්‍රික්කයට පානීය ජලය සැපයීම. | | |

| | |
|---|---|
| **සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ** | දිනකට 54,000 **m3** සැලසුම් ධාරිතාව පරීක්ෂා කිරීමෙන් පසු ජල සැපයුම් ව්‍යාපෘතියේ වර්තමාන ඉල්ලුම සපුරාලීම සඳහා ජලය 2023 ඔක්තෝම්බර් 20 සිට ජලය ලබා දෙනු ලැබේ. |
| **අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු** | • ඉඩම් අත්පත් කර ගැනීමේදී ඇතිවූ ගැටළු, COVID 19 වසංගත තත්වය හා ඉදිකිරීම් ද්‍රව්‍ය හා ඉන්ධන හිගතාවය.<br>• 2023 හා 2024 වසර වල පැවති අයහපත් කාලගුණික තත්වය<br>• මුදල් ප්‍රවාහ ගැටළුව. |
| **අභියෝග** | • අසාමාන්‍ය කාලගුණික තත්වය<br>• අමුද්‍රව්‍ය වල මිල ඉහළ යාම. |

## 2. ඒකාබද්ධ ජලධාර හා සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තු මුදල** | රු.මි. 6311.21<br><br>(Repurpasing - රු.මි. 1016<br>අදියර 1 - රු.මි. 1979.18<br>අදියර 2 - රු.මි. 2080.83<br>CERC -රු.මි. 1235.00) | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | මුලතිව්, යාපනය සහ කිලිනොච්චිය හැර දිස්ත්‍රික්ක 22 කි |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ලෝක බැංකුව | **ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය** | වාරිමාර්ග යෝජනා ක්‍රම 20 ක් ප්‍රතිසංස්කරණය කිරීම සහ දිස්ත්‍රික්ක 22 ක තුල වාරිමාර්ග උප පද්ධතියේ අත්‍යවශ්‍ය සහ හදිසි පුනරුත්ථාපන කටයුතු සිදු කිරීම |
| **ව්‍යාපෘති කාලය** | 2021 – 2027 | **ප්‍රතිලාභීන්** | අදාළ ගොවි සංවිධානයන් හි සියලුම සාමාජිකයින් සහ එම යෝජනා ක්‍රම යටතේ ප්‍රතිලාභ ලබන අනෙකුත් පාර්ශවකරුවන් සහ පරිශීලකයින් |
| **ප්‍රතිපාදන 2025** | රු.මි. 2,420.00 | **2026 වසර සඳහා ප්‍රතිපාදන** | රු.මි. 2655.80 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 2131.00 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | Repurpasing 95 %<br>අදියර 1 90 %<br>අදියර 2 10 % |
| **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 516.14 (අදියර 1 - රු.මි. 242.73 , Repurpasing - රු.මි. 273.41) | | |

| | | |
|---|---|---|
| **2025** වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම | අදියර 01 දී repurposing යටතේ වැඩ 377 ක් සහ ප්‍රධාන පැකේජ 4 ක් සම්පූර්ණ කරනු ලැබූ අතර එමගින් කුඹුරු සඳහා පහසුවෙන් ජලය ගෙනයාමට හැකියාව ලැබී ඇත. | රු. මි. 2131 |
| **2026** වසර සඳහා යෝජිත වැඩසටහන | අදියර **01** හි ඉතිරි ප්‍රධාන පැකේජ **06** , අදියර **02** දී ප්‍රධාන පැකේජ **14** සහ **CERC** සංරචකය සම්පූර්ණ කිරීම. | |
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ | ජලාශ සහ ඇළ මාර්ග ආරක්ෂා කිරීම, ජල හානිය අවම කිරීම සහ වගා කරන ඉඩම් ප්‍රමාණය වැඩි කිරීම | |
| සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ | ජලාශ සහ ඇළ මාර්ග ආරක්ෂා කිරීම, ජල හානිය අවම කිරීම සහ වගා කරන ලද ඉඩම් ප්‍රමාණය වැඩි කිරීම. | |
| අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු | අනපේක්ෂිත කාලගුණික රටා සහ කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ දැනුමෙහි පවතින දුර්වලතා. | |
| අභියෝග | ජලය නිකුත් කිරීමත් සමගම ඉදිකිරීම් කටයුතුද සිදු කිරීමට සිදුවීම | |

### 3. දේශගුණික අවබලපෑම් - බහු පියවර වැඩසටහන් ක්‍රියාමාර්ග ප්‍රවේශය ( CResMPA)

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තු මුදල | ඇ.ඩො.මි. 17 | ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක | සියලුම දිස්ත්‍රික්ක (25) |
| මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය | ශ්‍රී ලංකා ජනරජය / ලෝක බැංකුව | ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය | හෙක්ටයාර 21,000 |
| ව්‍යාපෘති කාලය | 2022-2025 | ප්‍රතිලාභීන් | 336,337 |
| ප්‍රතිපාදන **2025** | රු.මි. 4,000.00 | **2026** වසර සඳහා ප්‍රතිපාදන | රු.මි. 1,500.00 |
| සමුච්චිත මූල්‍ය ප්‍රගතිය | රු.මි. . 3,355.44 | සමස්ථ භෞතික ප්‍රගතිය (%) | 82% |
| **2025** වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය | රු.මි. 1,238.02 | | |
| **2025** වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම | 2025 වර්ෂය තුල 8 % ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත. | | |
| **2026** වසර සඳහා යෝජිත වැඩසටහන | ඉතිරි සියළුම වැඩ 2026 වර්ෂය ඇතුලත නිම කිරීම. | | |
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ | • දිවයින පුරා පුද්ගලයින් 336,337 ක් සඳහා ප්‍රතිලාභ ලබා දීම.<br>• හෙක්ටයාර 21,000 ක වගා ඉඩම් ප්‍රමාණයකට ප්‍රතිලාභලබා දීම.<br>• ඇළ මාර්ග කි.මී. 99.14ක් වැඩිදියුණු කිරීම | | |

| | |
|---|---|
| **සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ** | • දිවයින පුරා ප්‍රතිලාභීන් 658,126<br>• හෙක්ටයාර 42,677.86 වගා ඉඩම් ප්‍රමාණයකට ප්‍රතිලාභ<br>• කි.මී. 136.3 ක දිග ඇල මාර්ග සංවර්ධනය කර ඇත. |
| **අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු** | • අනපේක්ෂිත වර්ෂාව<br>• වැඩ ක්‍රියාත්මක කිරීමේදී සඳහා ගොවි සංවිධාන සහ කොන්ත්‍රාත්කරුවන් විසින් දක්වන අනපේක්ෂිත ප්‍රමාදයන් |
| **අභියෝග** | • තාක්ෂණික කාර්ය මණ්ඩල හිඟය<br>• අනෙකුත් දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය. (PID සහ DAD)<br>• පවතින කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට දිරිගැන්වීමක් නොමැති වීම. |

## 2.2 අභියෝග

- ඉංජිනේරු සේවයේ වැඩි ප්‍රතිශතයක් විදේශ රැකියා සඳහා යොමුවීමත්, එම පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම හා නව බඳවා ගැනීම් සිදු නොකිරීම නිසා ක්ෂේත්‍ර මට්ටමේ රාජකාරි සඳහා අවශ්‍ය වන වාරිමාර්ග ඉංජිනේරුවරුන් 50%ක් පමණ සක්‍රීය සේවයෙන් බැහැරගොස් සිටීම සහ එම හිඟ නිලධාරීන්ගේද සේවය ආවරණය කරමින් රාජකාරී කිරීමට සිදුවීම.
- ක්ෂේත්‍රයේ තාක්ෂණික කටයුතු ඉටු කිරීමට අවශ්‍ය වන ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරීන්ගේ හිඟතාවය සහ ඒ වෙනුවට අලුතින් නිලධාරීන් බඳවා නොගැනීම.
- ක්ෂේත්‍රයේ රාජකාරී කටයුතු නිරන්තර අධීක්ෂණය යටතේ සිදුකල යුතු වුවත් විටින් විට පනවනු ලබන චක්‍රලේඛ විධිවිධාන මගින් අවබලපෑම් සිදුවීම හා ඒ අනුව සැළසුම් කල ප්‍රගතිය ලබාගත නොහැකි වීම.
- නොවැම්බර් මස අවසාන සතියේ දිවයිනට බලපෑ "දිට්වා" සුළි කුණාටු තත්වය නිසා වාරිමාර්ග යටිතල පහසුකම් වලට දැනට තක්සේරු කර ඇති පරිදි දැනට රුපියල් බිලියන 28 ක පමන අලාභයක් සිදුවී ඇති අතර එම වාරි පහසුකම් නැවත යථාවත් කර ගොවි ජනයා වෙත නිසි වෙලාවට ජල පහසුකම් ලබා දීම.
- පවත්නා ඉංජිනේරු සේවාවන් හා වෙනත් තාක්ෂණික සේවාවල නිළධාරී හිඟය මධ්‍යයේ දෙපාර්තමේන්තුවේ වාර්ෂික ප්‍රතිපාදන සීමාව ඉක්මවා සිදුවී ඇති ඉහත අලාභානි කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම.
- රටතුල පැවති ආර්ථික අර්බුදය නිසා RAMP හා NOR (ජාතික මෙහෙයුම් මැදිරිය) කමිටු තීරණ මත වැඩ නවත්වන ලද සංවර්ධන යෝජනා ක්‍රම නැවත ආරම්භ කිරීම.
- අයතා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ජලාශ, වැව්, පොකුණු, ගංගා සහ ස්වභාවික ජල මාර්ගවල ගුණාත්මකභාවයට සිදුවන බලපෑම අවම කිරීම.
- ගංවතුර හා නියඟ අවම කිරීම සඳහා නව ජලාශ ඉදිකිරීමට අවශ්‍ය වන ඉඩම් නිදහස් කර ගැනීමේ අපහසුතාවය සහ අවතැන්වන පුද්ගලයන් සඳහා නව ඉඩම් ලබා දීම.
- වගා තිව්‍රතාවය වැඩි කිරීම සහ වෙනත් ක්ෂේත්‍ර භෝග අවශ්‍යතාවයන්ගෙන් ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීම සඳහා භෝග වගා කිරීම පිළිබඳ ආකල්පය වෙනස් කිරීමට ගොවිමහත්වරුන් දක්වන ප්‍රතිරෝධය.
- වගා ඉඩම් වල ඵලදායිතාව වැඩි දියුණු කිරීම (නව ජල කළමනාකරණ ක්‍රමවේදයන් සහ බෝග විවිධාංගීකරණය කිරීමෙන් පවතින ජලයෙන් උපරිම භූමි ප්‍රමාණයක් වගා කිරීම)
- ක්ෂේත්‍ර කාර්යමණ්ඩලයේ හිඟතාවය සහ ඇල මාර්ග නිරන්තර ප්‍රතිසංස්කරණයට ලක් නොකිරීම නිසා ඇල මාර්ග වල මුල් කොටසේ මෙන්ම අග කොටසේද වගා කටයුතු කරන ගොවීන් සඳහා සමාන ජල ප්‍රමාණයන් ලබා දීම.
- ක්ෂේත්‍ර මට්ටමේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිසි අධ්‍යනයකින් තොරව අදාළ ක්ෂේත්‍ර කටයුතු භාර ආයතන මගින් විමසීමකින් තොරව පොදුවේ නිකුත් කරනු ලබන භාණ්ඩාගාර චක්‍රලේඛන හා මූල්‍ය රෙගුලාසි.
- ජලාශවල හා වාරිමාර්ග ඇළ මාර්ගවල පැතිරී ඇති ආක්‍රමණශීලී ජලජ ශාක පාලනය කරමින් මනා ජල කළමනාකරණයක් සිදු කිරීම.
- ජීවිත සහ දේපළවලට සිදුවන හානිය අවම කරමින් හැකි ඉක්මනින් ගංවතුර බැස යාමට පහසුකම් සැලසීම සඳහා නාගරික ප්‍රදේශවල ඇති සියලුම ජලාපවහන ඇල මාර්ග සුද්ද කිරීම සහ ඇතැම් ඇල මාර්ග අවහිර වන සේ ඉදිකර ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කර නියමිත ප්‍රමිතියට පවත්වාගන යාම.

- අනවසරයෙන් අල්ලාගෙන සිටින රක්ෂිත ඉඩම් නිදහස් කර ගැනීම, රක්ෂිත ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය ඉඩම් සහ අනෙකුත් පාරිසරික සංවේදී ප්‍රදේශ අත්පත් කර ගැනීම සහ එවැනි රක්ෂිත ආරක්ෂා කිරීම.
- මහා පරිමාණ , නීති විරෝධී, තාක්‍ෂණික නොවන වැලි සහ වෙනත් කැණීම් වලින් ගංගා සහ ගංගා අවට ප්‍රදේශ ආරක්ෂා කර ගැනීම.
- ජලය හා සම්බන්ධ මූලික අයිතිය ආරක්ෂා කරමින් වාරිමාර්ග ජල අවශ්‍යතා සපුරාලමින් පානීය හා කාර්මික ජල අවශ්‍යතා සැපයීම.
- ප්‍රසම්පාදන සීමාවන් සීමා කිරීම.

## 2.3 ඉදිරි ඉලක්ක

- ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපාර වල කුඹුරු අක්කරයක් වගා කිරීම සඳහා යොදාගන්නා ජල ප්‍රමාණය 2027 වන විට මහ කන්නයේ අක්කර අඩි 3.5 සිට 3.3 දක්වාත් යල කන්නයේදි අක්කර අඩි 4.8 සිට 4.6 දක්වාත් අඩු කිරීම.
- ප්‍රධාන වාරිමාර්ග ජලාශවල ධාරිතාව 2027 වන විට ඝණ මීටර් මිලියන 20 කින් වැඩි කිරීම.
- වාරිමාර්ග ව්‍යාපාරවල යල කන්නයේ වගා තීව්‍රතාවය 2027 වසර වන විට 85% දක්වාත් මහ කන්නයේ වගා තිව්‍රතාවය 96% දක්වාත් වැඩි කිරීම.
- 2029 වන විට නව කුඹුරු හෙක්ටයාර් 5,000 ක් සඳහා වාරි ජල පහසුකම් ලබාදීම.
- ගංවතුර ආපදා අවම කරගැනීම සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියට දත්ත ලබාගැනීම සඳහා 2027 වන විට දත්ත ලබාගැනීමේ ස්ථාන සංඛ්‍යාවට තවත් මධ්‍යස්ථාන 100 ක් එකතු කිරීම.



**ආචාර්ය (ඉංජි). කේ වැලිගෙපොලගේ**
**වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්**

ආචාර්ය. (ඉංජි.) කිත්සිරි වැලිගෙපොලගේ
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

## පරිච්ඡේදය 03

# 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

### 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු. | | සටහන | තතය 2025 රු. | 2024 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 18,429,913,000 | 18,209,704,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 2,215,742,553 | 4,510,108,447 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම | | 230,480,030 | 220,321,153 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **20,876,135,583** | **22,940,133,600** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **20,876,135,583** | **22,940,133,600** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 15,885,813 | 370,031,510.00 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **20,860,249,770** | **22,570,102,090** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 4,155,315,835 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 4,126,957,761 | 3,690,876,903 | |
| 647,190,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 577,157,312 | 660,055,792 | ඒසීඒ-2(ii) |
| 14,060,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 13,368,150 | 11,682,360 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | 550,000 | |
| 4,816,565,835 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **4,717,483,223** | **4,363,165,055** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **මූලධන වියදම්** | | | | |
| 9,245,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 8,407,608,465 | 5,384,892,665 | |
| 10,003,200,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 4,846,186,008 | 7,577,874,798 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - | **ඒසීඒ- 2(ii)** |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 14,000,000 | හැකියා වර්ධනය | **14** | 12,095,722 | 7,293,840 | |
| 140,000,000 | වෙනත් මූලධන වියදම් | **15** | 103,144,176 | 78,168,248 | |
| 19,402,200,000 | **මුළු මූලධන වියදම් (උ)** | | **13,369,034,371** | **13,048,229,551** | |
| | තැන්පතු ගෙවීම් | | 2,109,026,320 | 4,469,271,367 | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 285,352,416 | 286,144,200 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
